# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2003 අංක 39 දරන බද්ධ නිවාස අයිතිකම් (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 2003 නොවැම්බර් මස 18 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2003 නොවැම්බර් මස 21 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

---

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිළ : රු. 39.50 යි. තැපැල් ගාස්තුව : රු. 15.75 යි.

## 2003 අංක 39 දරන බද්ධ නිවාස අයිතිකම් (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2003 නොවැම්බර් මස 18 වන දින.]

එල්. ඩී.–ඕ. 52/2001.

**ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 11 දරන බද්ධ නිවාස අයිතිකම් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :–

ලුහුඬු නාමය.

**1.** මේ පනත 2003 අංක 39 දරන බද්ධ නිවාස අයිතිකම් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

1973 අංක 11 දරන පනතේ දීර්ඝ නාමය ප්‍රතියෝජනය කිරීම.

**2.** (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 11 දරන බද්ධ නිවාය අයිතිකම් පනතේ දීර්ඝ නාමය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන දීර්ඝ නාමය ආදේශ කරනු ලැබේ :–

"ගොඩනැගිලිවල සහාධිපත්‍ය කොටස්වලට අදාළ හිමිකම් ලියාපදිංචි කිරීම සඳහා ද, ගොඩනැගිල්ල අනුබද්ධ පොදු අංගෝපාංග ඇති සහාධිපත්‍ය කොටස්වලට නැවත බෙදා වෙන්කිරීම සහ ඒකාබද්ධ කිරීම සඳහා ද, එම කොටස්වලට වෙන් වශයෙන් අයිතිය ලබා ගැනීමට හැකිවීම පිණිස සහ ඒවායේ හිමිකම් බැහැර කිරීමට හැකිවීම පිණිස ද ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සඳහා ද විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 2 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ 2 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :–

'නීතිය අදාළවීම.

2. (අ) ඒක් ඉඩම් කොටසක් ලෙස දරනු ලබන අන්සතු ඉඩමක් මත ඉදිකරන ලද සහ (මෙහි මින් මතු "සහාධිපත්‍ය දේපළ" යනුවෙන් සඳහන් කරනු ලබන) කොටස්වලට නැවත බෙදා වෙන් කිරීමේ හැකියාව ඇති යම් ගොඩනැගිල්ලකට ;

(ආ) එක් ඉඩම් කොටසක් ලෙස දරනු ලබන අන්සතු ඉඩමක් මත ඉදිකිරීමට යෝජිත සහ (මෙහි මින් මතු "තාවකාලික සහාධිපත්‍ය දේපළ" යනුවෙන් සඳහන් කරනු ලබන) කොටස්වලට නැවත බෙදා වෙන්කිරීමේ හැකියාව ඇති යම් ගොඩනැගිල්ලකට ;

(ඇ) එක් ඉඩම් කොටසක් ලෙස දරනු ලබන අන්සතු ඉඩමක් මත අර්ධ වශයෙන් ඉදිකරනු ලැබ ඇති වූ ද මනුෂ්‍ය වාසය සඳහා සුදුසු (මෙහි මින් මතු "අර්ධ සහාධිපත්‍ය දේපළ" යනුවෙන් සඳහන් කරනු ලබන) සම්පූර්ණ කරන ලද සහාධිපත්‍ය කොටස් එකකට වැඩි ප්‍රමාණයක් පිහිටා ඇත්තා වූ ද යම් ගොඩනැගිල්ලකට,

මේ පනත අදාළ විය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :–

"සහාධිපත්‍ය පිඹුරක්, තාවකාලික සහාධිපත්‍ය පිඹුරක් හෝ අර්ධ සහාධිපත්‍ය පිඹුරක් ලියාපදිංචි කිරීම.

3. (1) අවස්ථාවෝචිත පරිදි යම් සහාධිපත්‍ය දේපළක හෝ යම් තාවකාලික සහාධිපත්‍ය දේපළක හෝ යම් අර්ධ සහාධිපත්‍ය දේපළක අයිතිකරු විසින් අවස්ථාවෝචිත පරිදි සහාධිපත්‍ය පිඹුරක් හෝ තාවකාලික සහාධිපත්‍ය පිඹුරක් හෝ අර්ධ සහාධිපත්‍ය පිඹුරක් ලියාපදිංචි කිරීම සඳහා, නියමිත ආකෘති පත්‍රයේ වූ ඉල්ලීමක්, නියමිත ගාස්තුව සමග රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

(2) 2 වන වගන්තිය යටතේ නැවත බෙදා, වෙන්කළ හැකි වූ ද පදිංචිය සඳහා හෝ භාවිතය සඳහා යෝග්‍ය බවට සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරියේ සාමාන්‍යාධිකාරිවරයා විසින් සහතික කරනු ලැබුවා වූ ද සම්පූර්ණ කරන ලද

ගොඩනැගිල්ලක් පිහිටා ඇති යම් ඉඩම් කොටසක අයිතිකරු විසින්, කවර හෝ අවස්ථාවක ඔහු විසින් විකුණා ඇත්නම් හෝ විකිණීමට එකඟ වී ඇත්නම් –

(අ) එසේ පළමු විකිණීමේ හෝ විකිණීමට එකඟවීමේ දින සිට මාස දහ අටක් ඇතුළත හෝ ඒ ගොඩනැගිල්ල සම්පූර්ණ කිරීමේ දින සිට මාස තුනක් ඇතුළත යන දින දෙකෙන් කලින් එළඹෙන දිනයට පෙර ;

(ආ) ගොඩනැගිල්ලේ යම් කොටසක් පළමුවරට විකිණීම හෝ විකිණීමට එකඟවීම සිදු වූයේ එම ගොඩනැගිල්ල සම්පූර්ණ කිරීමේ දිනයට පසුව නම්, එම ගොඩනැගිල්ල සම්පූර්ණ කිරීමේ දින සිට මාස හයක් ඇතුළත,

අවස්ථාවෝචිත පරිදි (අ) හෝ (ආ) ඡේදවල නිශ්චිතව දක්වා ඇති කාලය ඇතුළත, නියමිත ගාස්තුව සමඟ නියමිත ආකෘති පත්‍රයෙහි වූ ඉල්ලීමක් රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉදිරිපත් කළ යුතු අතර, ඒ සභාධිපත්‍ය පිඹුර ඒ ඉල්ලීම සමඟ ඉදිරිපත් කළ යුතු ය.

(3) (අ) (2) වන උපවගන්තිය යටතේ නිශ්චිතව දක්වා ඇති කාල සීමාව දීර්ඝ කිරීම සඳහා අයිතිකරු විසින්, සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරියේ සාමාන්‍යාධිකාරිවරයා වෙත ඉල්ලීමක් ඉදිරිපත් කළ යුතු ය.

(ආ) (අ) ඡේදය යටතේ අයිතිකරු විසින් සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය වෙත ඉල්ලීමක් කරනු ලැබූ අවස්ථාවක, සාමාන්‍යාධිකාරිවරයා විසින්, රෙජිස්ට්‍රාර්වරයා විමසා, මාස හයකට නොවැඩි කාලසීමාවක් තවදුරටත් ලබා දිය හැකි ය.

(4) (2) වන උපවගන්තියේ විධිවිධාන හෝ (3) වන උපවගන්තියේ විධිවිධාන කඩකරන යම් තැනැත්තෙක් අවස්ථාවෝචිත පරිදි වරදකට

වරදකරු වන අතර මහේස්ත්‍රාත්වරයකු ඉදිරිපිට පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් වරදකරු කරනු ලැබීමේ දී රුපියල් පනස් දහසකට නොවැඩි දඩයකට හෝ එසේ වරදකරු කරනු ලැබීමෙන් පසු එම වරද සිදු කරන එක් එක් දිනය සඳහා දිනකට රුපියල් දහස බැගින් වූ දඩයකට ඔහු යටත් විය යුතු ය.''.

ප්‍රධාන ප්‍රඥප්තියට 3ඇ, 3ආ සහ 3ඇ යන අලුත් වගන්ති ඇතුළත් කිරීම.

**5.** 3 වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්ති මෙයින් ඇතුළත් කරනු ලබන අතර, ඒවා ප්‍රධාන ප්‍රඥප්තියේ 3අ, 3ආ සහ 3ඇ යන වගන්ති ලෙස බලාත්මක විය යුතු ය :–

''සහාධිපත්‍ය පිඹුරක් ලියාපදිංචි කිරීම සඳහා ඉල්ලුම් කිරීම.

3අ. (1) (අ) සහාධිපත්‍ය පිඹුරක් ලියාපදිංචි කිරීම සඳහා වූ සෑම ඉල්ලීමක්ම පිටපත් තුනකින් යුක්තව නියමිත ආකෘති පත්‍රයකින් ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(ආ) ඒ ඉල්ලීමේ "මුල් පිටපත" සහ "දෙවන පිටපත" රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉදිරිපත් කළ යුතු අතර, "තුන්වන පිටපත" සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරියේ සාමාන්‍යාධිකාරිවරයා වෙත යවනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ වූ සෑම ඉල්ලීමක් සමගම –

(අ) නියමිත ගාස්තුව ;

(ආ) සැලසුම් අධිකාරිය විසින් අනුමත කරන ලද ගොඩනැගිල්ලේ සැලැස්මේ පිටපත් තුනක් ;

(ඇ) 5 වන වගන්තියේ නිශ්චිතව දක්වා ඇති විස්තර ඇතුළත් සහාධිපත්‍ය පිඹුරේ පිටපත් තුනක් ;

(ඈ) අවසරය ලබා දුන් සැලැස්මට සහ පිරිවිතරවලට අනුකූලව ගොඩනැගිල්ල සාදනු ලැබූ බවටත් එම අවසරය ලබා

දුන් දිනයන්, එම අවසරයේ යොමු අංකයන් සඳහන් කරමින් සුදුසුකම් ලත් වාස්තු විශේෂඥයකු හෝ සුදුසුකම් ලත් සිවිල් සේවා ව්‍යුහ ඉංජිනේරුවකු විසින් නිකුත් කරන ලද සහතිකයක් :

(ඉ) (i) ඉඩමේ යම් බෙදීමකට ;

(ii) සම්පූර්ණ ඉඩමේ හෝ එහි කොටසක බද්ධකට :

(iii) එවැනි බද්ධක යම් බෙදීමකට ; හෝ

(iv) එම ඉඩම හෝ එම බද්ධ සම්බන්ධ වූ යම් ඇපයකට,

යම් තැනැත්තකුට හිමිකම් ඇත්නම් එම තැනැත්තාගේ ලිඛිත කැමැත්ත ;

(ඊ) ඉඩම පිහිටා ඇත්තේ සහ ගොඩනැගිලි සැලැස්ම අනුමත කිරීමට බලය ඇත්තේ යම් පළාත් පාලන අධිකාරියකට ද එම පළාත් පාලන අධිකාරිය විසින් නිකුත් කරනු ලැබූ අනුකූලතා සහතිකයක් ;

(උ) ඉඩම් කොටස සඳහා වූ හිමිකම් සහතිකය :

එසේ වුව ද, ඉඩම් කොටසේ හිමිකම් සහතිකය අයිතිකරුගේ සන්තකයෙහි නොමැති අවස්ථාවක සහ වෙනත් යම් තැනැත්තකුගේ සන්තකයෙහි ඇති අවස්ථාවක එම හිමිකම් රෙජිස්ට්‍රාර්වරයා වෙත භාරදීම සඳහා සහතිකයේ පිටපතක් ඉල්ලීම් සඳහන් දින සිට දින දාහතරක් ඇතුළත ඉදිරිපත් කරන ලෙස එම අයිතිකරු විසින් අනෙක් තැනැත්තා වෙත කරනු ලබන ඉල්ලීමක පිටපතක් එම ඉල්ලුම් පත්‍රයට අමුණා තිබිය යුතු ය.

(ඌ) (i) ලියාපදිංචි කිරීමට බලාපොරොත්තු වන සහාධිපත්‍ය දේපළෙහි උකසක් ඇති අවස්ථාවක දී –

(අ) සහාධිපත්‍ය දේපළ උකස් කිරීමෙන් ලබාගත් මුදල සහ එම මූල්‍ය ආයතනයේ නම ;

(ආ) ඉහත කී උකස යටතේ ණයට ගත් සම්පූර්ණ මුදල සහ ලියාපදිංචි කිරීමට යෝජිත එක් එක් සහාධිපත්‍ය කොටසට එරෙහිව ලබාගත් මුදල,

සම්බන්ධයෙන් විස්තර සඳහන් කරමින් ඉල්ලුම්කරු විසින් කරනු ලබන ප්‍රකාශයක් ;

(ii) ලියා පදිංචි කිරීමට යෝජිත සහාධිපත්‍ය දේපළ මත කිසිදු උකසක් නොමැති අවස්ථාවක අයිතිකරු විසින් ඒ පිළිබඳ ප්‍රකාශයක් ;

(එ) ගොඩනැගිල්ලේ සහාධිපත්‍ය කොටස්වල පදිංචිකරුවන්ගේ ප්‍රතිලාභය සහ සුභසාධනය සහ සපයා ඇති පොදු පහසුකම් පිළිබඳව සෑහීමට පත්විය හැකි බවටත් සහාධිපත්‍ය දේපළේ පොදු අංගෝපාංග පාලනය කිරීම, පරිපාලනය කිරීම, නඩත්තු කිරීම හෝ කළමනාකරණය කිරීම සම්බන්ධයෙන් යොදා ඇති වැඩපිළිවෙල පිළිබඳව සෑහීමට පත්විය හැකි බවටත් සහතික කරමින් සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරියේ සාමාන්‍යාධිකාරිවරයා විසින් නිකුත් කරනු ලබන සහතිකයක් ;

(ඒ) ප්‍රසිද්ධ නොතාරිස්වරයකු විසින් සහතික කරනු ලබන්නා වූ ද ඉල්ලුම්කරු විසින් කරනු ලබන්නා වූ ද ප්‍රකාශයක පහත සඳහන් කරුණු ඇතුළත් විය යුතු ය :–

(i) ගොඩනැගිල්ල සාදා ඇති සහ හිමිකම ඉදිරිපත් කරන ඉඩම් කොටසේ කැඩැස්තර සිතියම උපයෝගී කර ගනිමින් එම ඉඩමේ මායිම්, ප්‍රමාණය සහ පිහිටීම ද, එම ඉඩම්

කොටස පිහිටි පරිපාලන දිස්ත්‍රික්කය, ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාසය, ගම, නාගරික කොට්ඨාසය, පත්තුව, කෝරළය හෝ වෙනත් කොට්ඨාසයක් හෝ දිස්ත්‍රික්කයක් සඳහන් කරමින් එම ඉඩමේ පිහිටීම පිළිබඳ විස්තරයක් සහ ඉඩම් කොටස පිහිටා ඇත්තේ යම් නගරයක නම් එම ඉඩම පිහිටි වීථියෙහි නම සහ වරිපනම් අංකය ;

(ii) සහාධිපත්‍ය කොටසේ අයිතිකරු හෝ අයිතිකරුවන්ගේ නම සහ ලිපිනයන් ;

(iii) හිමිකම් ඉදිරිපත් කිරීම සනාථ කිරීමේ දී ඉල්ලුම්කරු විසින් විශ්වාසය තබා ඇති ඔප්පුවල, සාධන පත්‍රවල හෝ වෙනත් ලේඛනවල විස්තර සහ හිමිකම පිළිබඳ වෙනත් සාක්ෂි ;

(iv) 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ විධිවිධාන යටතේ හිමිකම ලියාපදිංචි කර ඇති කොටස, වෙළුම සහ පත්‍රිකාව පිළිබඳ සඳහනක් සහ ඉඩම් කොටස ලියාපදිංචි කර නැත්නම් ඉඩම් කොටස එසේ ලියාපදිංචි කර නොමැති බවට වූ ප්‍රකාශයක් ;

(v) ඉල්ලුම්කරුගේ දැනීම අනුව ඉඩම් කොටසට බලපාන සෑම බැඳීමක් ම, විනිශ්චයට භාජනය වී ඇති නඩුවක් තහනමට ගැනීමක්, ආඥාවක් සේ තීන්දු ප්‍රකාශයක් පිළිබඳ විස්තර ;

(vi) මහල් ගණන සහ පතුල් මහල් ගණන සහ සහාධිපත්‍ය කොටස් ප්‍රමාණය සඳහන් කරමින් ගොඩනැගිල්ල පිළිබඳ විස්තරයක් ;

(vii) එක් එක් සහාධිපත්‍ය කොටස හඳුනා ගැනීමේ අංකයක් හෝ අන් සංකේතයක් සහ එහි පිහිටීම, බිමෙහි වර්ගඵලය, කාමර සංඛ්‍යාව, එයින් පිවිසිය හැකි ලඟම ඇති යම් පොදු ප්‍රදේශයක් සහ උපකාරක කොටසට අදාළ අනුරූප තොරතුරු ඇතුළු හඳුනා ගැනීමේ කාර්ය සඳහා වූ වෙනත් යම් තොරතුරු ;

(viii) සහාධිපත්‍ය දේපළේ පොදු අංගෝපාංග පිළිබඳ විස්තරයක් ;

(ix) උපකාරක කොටස් නිශ්චිත සහාධිපත්‍ය කොටස්වලට සම්බන්ධ වුව ද එසේ නැති වුව ද එය නොතකා අනුබද්ධව සිටින සහාධිපත්‍ය කොටස් නිශ්චිතව දක්වමින් සහාධිපත්‍ය දේපළේ උපකාරක කොටස් පිළිබඳ විස්තරයක් ;

(x) සහාධිපත්‍ය දේපළේ පොදු අංගෝපාංගවලට එක් එක් සහාධිපත්‍ය කොටසේ ඇති නොබෙදූ හිමිකම් වටිනාකම ;

(xi) එක් එක් සහාධිපත්‍ය කොටසට අනුබද්ධිත පොදු අංගෝපාංගවල නොබෙදූ හිමි කොටස්වල ප්‍රතිශතය ;

(xii) ගොඩනැගිල්ල සහ එක් එක් සහාධිපත්‍ය කොටස භාවිත කිරීම සම්බන්ධයෙන් අදහස් කරනු ලබන සහ සීමා කරනු ලබන කාර්යයන් පිළිබඳ ප්‍රකාශයක් ;

(xiii) අනාගත මිල දී ගන්නන්ගෙන් දැනටමත් ලබාගෙන ඇති අත්තිකාරම් මුදල් පිළිබඳ ගිණුම් ප්‍රකාශයක් සහ සහාධිපත්‍ය පිඹුරෙහි සහාධිපත්‍ය කොටස් වෙන්කිරීම සඳහා ඔවුන්ගේ නම් ;

(xiv) මේ නීතියට අනුකූලව සහාධිපත්‍ය දේපළට අදාළව ඉදිරිපත් කිරීම අවශ්‍ය යයි ඉල්ලුම්කරු විසින් සලකනු ලබන තවදුරටත් වූ තොරතුරු ;

(xv) යම් ලිඛිත නීතියක් මගින් හෝ එය යටතේ සැපයිය යුතු බවට නියම කරනු ලැබිය හැකි වෙනත් යම් තොරතුරු ;

(xvi) සහාධිපත්‍ය දේපළේ අයිතිකරු හෝ අයිතිකරුවන්ගේ අත්සන් ;

(ඔ) අවස්ථාවෝචිත පරිදි ලියාපදිංචිය සිදුවන්නේ අර්ධ සහාධිපත්‍ය පිඹුරක් හෝ තාවකාලික සහාධිපත්‍ය පිඹුරේ වන විට යොමු අංකය,

ඉදිරිපත් කළ යුතු ය.

තාවකාලික සහාධිපත්‍ය පිඹුරක ලියාපදිංචිය සඳහා වූ ඉල්ලීම.

3ආ. (1) (අ) තාවකාලික සහාධිපත්‍ය පිඹුරක ලියාපදිංචිය සඳහා වූ සෑම ඉල්ලීමක්ම පිටපත් තුනකින් යුක්තව නියමිත ආකෘති පත්‍රයෙහි ඉදිරිපත් කළ යුතු ය.

(ආ) ඒ ඉල්ලීමේ "මුල් පිටපත" සහ "දෙවන පිටපත" රෙජිස්ට්‍රාර්වරයා වෙත යැවිය යුතු අතර, "තුන්වන පිටපත" සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරියේ සාමාන්‍යාධිකාරිවරයා වෙත යැවිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ ඉදිරිපත් කරනු ලබන සෑම ඉල්ලීමක් සමඟම –

(අ) නියමිත ගාස්තුව ;

(ආ) සැලසුම් අධිකාරිය විසින් අනුමත කරනු ලැබූ ගොඩනැගිලි සැලැස්මේ පිටපත් තුනක් ;

(ඇ) 5 ආ වගන්තියෙහි නිශ්චිතව දක්වා ඇති විස්තර ඇතුළත් තාවකාලික සහාධිපත්‍ය පිඹුර ;

(ඈ) (i) ඉඩම යම් බැඳීමකට ;

(ii) ඉඩම සම්පූර්ණයෙන්ම හෝ එහි යම් කොටසක් බද්දකට ;

(iii) එවැනි බද්දක යම් බැඳීමකට ; හෝ

(iv) ඒ ඉඩම පිළිබඳ ඇපයක් හෝ එවැනි බඳුදීමක,

යම් තැනැත්තකුට හිමිකම් ඇත්නම්, එවැනි සෑම තැනැත්තකුගේම ලිඛිත කැමැත්ත ;

(ඉ) ඉඩම් කොටස සඳහා හිමිකම් සහතිකය :

එසේ වුව ද ඉඩම් කොටසේ හිමිකම් සහතිකය අයිතිකරුගේ සන්තකයෙහි නොමැති අවස්ථාවක සහ වෙනත් යම් තැනැත්තකුගේ සන්තකයෙහි ඇති අවස්ථාවක, හිමිකම් රෙජිස්ට්‍රාර්වරයා වෙත භාරදීම සඳහා සහතිකයේ පිටපතක් ඉල්ලීමේ සඳහන් දින සිට දින දහහතරක් ඇතුළත ඉදිරිපත් කරන ලෙස ඉල්ලමින් අයිතිකරු විසින් අනෙක් තැනැත්තා වෙත කරනු ලබන ඉල්ලීමක පිටපතක් එම ඉල්ලුම් පත්‍රය සමඟ ඉදිරිපත් කළ යුතු ය.

(ඊ) (i) යෝජිත ගොඩනැගිල්ලට සැලැස්විය යුතු පොදු පහසුකම් සඳහා අවශ්‍ය විධිවිධාන, අනුමත ගොඩනැගිලි සැලැස්මෙහි සලසා ඇති බවට ;

(ii) කළමනාකරණ සංස්ථාව විසින් පොදු අංගෝපාංග යථා පරිදි පාලනය කිරීම, පරිපාලනය කිරීම, නඩත්තු කිරීම හෝ කළමනාකරණය කිරීම සහතික කිරීම පිණිස යෝජිත ගොඩනැගිලි

සැලැස්මෙහි යෝජිත ගොඩනැගිල්ලෙහි පොදු අංගෝපාංග නිසි පරිදි සැලසුම් කර ඇති බවට,

සහතික කරමින් සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරියේ සාමාන්‍යාධිකාරිවරයා විසින් නිකුත් කරනු ලබන සහතිකයක් ;

(ද) (i) එම ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා මූල්‍යාධාර තිබෙන බව සඳහන් කරමින් පිළිගත් මූල්‍ය ආයතනයකින් ලබාගත් සහතිකයක් මඟින් සනාථ කරනු ලබන, එම ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා අරමුදල් තිබෙන බවට ;

(ii) තාවකාලික සභාධිපත්‍ය දේපළ උකස් කිරීමෙන් දැනටමත් උපයාගෙන ඇති හෝ උපයා ගැනීමට අදහස් කරන මුදල් පිළිබඳ තොරතුරු සහ එක් එක් තාවකාලික සභාධිපත්‍ය කොටස හෝ කොටස්වලට එරෙහිව ලබාගත් හෝ ලබා ගැනීමට නියමිත මුදල සහ පිළිගත් මූල්‍ය ආයතනයකින් ලබාගත් සහතිකයක් මගින් සනාථ කරනු ලබන ඒ මූල්‍ය ආයතනයේ නම පිළිබඳව,

ඉල්ලුම්කරු විසින් ඉදිරිපත් කරනු ලබන ප්‍රකාශයක් ;

(ඩ) සුදුසුකම් ලත් ප්‍රමාණ මිනින්දෝරුවරයකු, හෝ සුදුසුකම් ලත් සිවිල් හෝ ව්‍යුහ ඉංජිනේරුවරයකු විසින් සත්‍යායනය කරනු ලබන ඉදිකිරීම් පිළිබඳ වියදම් ස්ථිර කිරීමේ මූල්‍ය වාර්තාවක් ;

(එ) අවස්ථාවෝචිත පරිදි සුදුසුකම්ලත් වාස්තු විද්‍යාඥයකු හෝ සුදුසුකම්ලත් සිවිල් හෝ ව්‍යුහ ඉංජිනේරුවරයකු විසින් නිකුත් කරන ලද සහතිකයක් මගින් සනාථ කරනු ලබන පහත දැක්වෙන එක් එක් ඉදිකිරීම් කටයුත්ත ආරම්භ කිරීමට යෝජිත දිනය සඳහන් කරමින් සම්පූර්ණ ඉදිකිරීම පිළිබඳ ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම :–

(i) අත්තිවාරම් කණු ;

(ii) බිත්ති ඉදිකිරීම ;

(iii) මහල් ඉදිකිරීම ;

(iv) වහළ ඉදිකිරීම ;

(v) මනුෂ්‍ය වාසය සඳහා සුදුසු ප්‍රමාණයට අවසාන ඉදිකිරීම් කටයුතු කිරීම ;

(ඒ) 3අ වගන්තියේ (2) උපවගන්තියේ (ඒ) ඡේදයේ නිශ්චිතව දක්වා ඇති අවශ්‍යතාවය ප්‍රසිද්ධ නොතාරිස්වරයකු විසින් සහතික කරන ලද ඉල්ලුම්කරුගේ ප්‍රකාශයක්,

ඉදිරිපත් කළ යුතු ය.

අර්ධ සහාධිපත්‍ය පිඹුරක් ලියාපදිංචි කිරීම සඳහා වූ ඉල්ලීම.

3ඈ. (1) (අ) අර්ධ සහාධිපත්‍ය පිඹුරක් ලියාපදිංචි කිරීම සඳහා වූ සෑම ඉල්ලීමක් ම පිටපත් තුනකින් යුක්තව නියමිත ආකෘති පත්‍රයෙහි ඉදිරිපත් කළ යුතු ය.

(ආ) ඒ ඉල්ලීමේ "මුල් පිටපත" සහ "දෙවන පිටපත" රෙජිස්ට්‍රාර්වරයා වෙත යැවිය යුතු අතර "තුන්වන පිටපත" සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරියේ සාමාන්‍යාධිකාරිවරයා වෙත යැවිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ වූ සෑම ඉල්ලීමක් සමගම–

(අ) නියමිත ගාස්තුව ;

(ආ) සැලසුම් අධිකාරිය විසින් අනුමත කරනු ලබන ගොඩනැගිලි සැලැස්මේ පිටපත් තුනක් ;

(ඇ) 5 ආ වගන්තියේ නිශ්චිතව දක්වා ඇති විස්තර ඇතුළත් අර්ධ සභාධිපත්‍ය පිඹුර ;

(ඈ) (i) ඉඩම යම් බද්දකට ;

(ii) සම්පූර්ණ ඉඩමේ හෝ එහි යම් කොටසක බද්දක ;

(iii) එවැනි බද්දක යම් බැඳීමකට ; හෝ

(iv) එම ඉඩම හෝ එවැනි යම් බද්දක් පිළිබඳ ඇපයක,

යම් තැනැත්තකුට හිමිකම් ඇත්නම්, එවැනි සෑම තැනැත්තකුගේම ලිඛිත කැමැත්ත ;

(ඉ) ඉඩම් කොටසේ හිමිකම් සහතිකයක් :

එසේ වුවද ඉඩම් කොටසේ හිමිකම් සහතිකය අයිතිකරුගේ සන්තකයේ නොමැති අවස්ථාවක සහ වෙනත් යම් තැනැත්තකුගේ සන්තකයෙහි ඇති අවස්ථාවක, හිමිකම් රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉල්ලීමේ සඳහන් දින සිට දින දාහතරක් ඇතුළත සහතිකය ඉදිරිපත් කරන ලෙස ඉල්ලමින් එම අයිතිකරු විසින් අනෙක් තැනැත්තා වෙත කරනු ලබන ඉල්ලීමක පිටපතක් එම ඉල්ලුම්පත්‍රයට අමුණා තිබිය යුතු ය.

(ඊ) සහාධිපත්‍ය කොටස්වල පදිංචිකරුවන්ගේ ප්‍රතිලාභය සහ සුභසාධනය සඳහා සපයනු ලබන පොදු පහසුකම් පිළිබඳව සෑහීමට පත් විය හැකි බවටත් සහාධිපත්‍ය දේපලේ පොදු අංගෝපාංගවල පාලනය, පරිපාලනය, නඩත්තුව සහ කළමනාකාරිත්වය පිළිබඳව සෑහීමට පත් විය හැකි බවටත් සහතික කරමින් සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරියේ සාමාන්‍යාධිකාරිවරයා විසින් නිකුත් කරනු ලබන සහතිකයක් ;

(උ) ඉඩම පිහිටා ඇත්තේ සහ ගොඩනැගිලි සැලැස්ම අනුමත කිරීමට බලය පැවරී ඇත්තේ යම් පළාත් පාලන අධිකාරියකට ද ඒ පළාත් පාලන අධිකාරියෙන් ලබාගත් අනුකූලතා සහතිකයක් ;

(ඌ) අර්ධ සහාධිපත්‍ය පිඹුරෙහි පෙන්නුම් කර ඇති සම්පූර්ණ කරන ලද සහාධිපත්‍ය කොටස් සහ තාවකාලික සහාධිපත්‍ය කොටස් අනුමත සැලසුම සහ පිරිවිතරවලට අනුකූලව ඇද ඇති බවටත් එම සැලසුම් හා පිරිවිතර අනුව අවසරය ලබාදුන් බවටත් එම අවසරය ලබාදුන් දිනය සහ එහි යොමු අංකය සඳහන් කරමිනුත් අවස්ථාවෝචිත පරිදි සුදුසුකම්ලත් වාස්තු විද්‍යාඥයකුගෙන් හෝ සුදුසුකම්ලත් වෘත්තියමය සිවිල් හෝ ව්‍යුහ ඉංජිනේරුවරයකුගෙන් ලබාගත් සහතිකයක් ;

(එ) අවස්ථාවෝචිත පරිදි ලියාපදිංචිය සිදුවන්නේ අර්ධ සහාධිපත්‍ය පිඹුරක හෝ තාවකාලික සහාධිපත්‍ය පිඹුරක වන විට යොමු අංකය ;

(ඒ) (i) උකසක් ඇති අවස්ථාවක ඉල්ලුම්කරු විසින්—

(අ) සහාධිපත්‍ය දේපළ උකස් කිරීමෙන් දැනටමත් ලබාගෙන ඇති මුදල් සහ ඒ මූල්‍ය ආයතනයේ නම :

(ආ) ඉහත කී උකස යටතේ ණයට ගත් සම්පූර්ණ මුදල සහ ලියාපදිංචි කිරීමට යෝජිත එක් එක් සහාධිපත්‍ය කොටසට එරෙහිව ලබාගත් මුදල,

පිළිබඳ ප්‍රකාශයක් ;

(ii) ලියාපදිංචි කිරීමට යෝජිත සහාධිපත්‍ය දේපළ පිළිබඳව කිසිම උකසක් නොමැති අවස්ථාවක, අයිතිකරු විසින් එම කරුණ පිළිබඳව ප්‍රකාශයක් ;

(ඔ) 3ආ වගන්තියේ (2) වන උපවගන්තියේ (ඒ) ඡේදයේ අවශ්‍යතා අඩංගුව ඇති ප්‍රසිද්ධ නොතාරිස්වරයකු විසින් සහතික කරන ලද ඉල්ලුම්කරුගේ ප්‍රකාශයක්,

ඉදිරිපත් කළ යුතු ය."

6. ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :— *ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.*

"සහාධිපත්‍ය පිඹුර. 5. (1) සහාධිපත්‍ය පිඹුරකට, බලයලත් මිනින්දෝරුවරයකු හෝ මිනුම්පතිවරයාගේ අධිකාරය මගින් හෝ එය යටතේ සකස්කොට අඳිනු ලැබූ මිනුම් පිඹුරක් හෝ පිඹුරු ඇතුළත් විය යුතු අතර–

(අ) සහාධිපත්‍ය දේපළේ මතුපිට මායිම් සහ මායිම් සලකුණු සහ ඒ මත පිහිටා ඇති එක් එක් නැවත බෙදා වෙන්

කළ ගොඩනැගිල්ල මතුපිට මායිම්වලට අදාළව පිහිටීම රූප රේඛනය කළ යුතු ය ;

(ආ) ඉඩම් කොටස ලියාපදිංචි කර ඇති කොට්ඨාසය, වෙළුම සහ පත්‍රිකාව එසේම එහි මනින ලද ප්‍රදේශය ද නිශ්චිතව දැක්විය යුතු ය.

(ඇ) (i) එක් එක් මහලේ බිම් ප්‍රමාණය සහ සීලිම ද ;

(ii) එක් එක් මහලේ උස ද,

පෙන්නුම් කරමින් එක් එක් නැවත බෙදා වෙන් කරන ලද ගොඩනැගිල්ලේ සිරස් කොටසක් ඇතුළත් විය යුතු ය ;

(ඈ) ගොඩනැගිලි සැලසුම් අනුමත කිරීම සඳහා තත්කාලයෙහි බලය දරන බලධරයා විසින් අනුමත කරනු ලැබූ ගොඩනැගිලි සැලසුම් සහ නැවත බෙදා වෙන්කිරීමේ සැලසුම්වලට අනුකූලව සම්පූර්ණ කරන ලද නැවත බෙදා වෙන් කළ ගොඩනැගිල්ලක් ලෙස සහාධිපත්‍ය දේපළ ඇතුළත ඉදිකරනු ලැබූ එක් එක් ගොඩනැගිල්ලේ විස්තරයක් සහ ඒ ගොඩනැගිල්ලේ සිරස් පැතිකඩක් සහ එහි දිග සහ පළල ද ඇතුළත් විය යුතු ය ;

(ඉ) එක් එක් සහාධිපත්‍ය කොටසේ (2) සහ (3) වන උපවගන්තිවල විධිවිධානවලට යටත්ව රූපරේඛනය කළයුතු අතර යම් දිගාංශයන් පෙන්වීමේ අවශ්‍යතාවයක් නොමැතිව, තිරස් දිග සහ පළල පෙන්නුම් කරමින් බිමේ ප්‍රමාණය සහ බිත්ති පිළිබඳව සඳහන් කරමින් එහි මායිම් නිර්ණය කළ යුතු ය ;

(ඊ) එක් එක් ගොඩනැගිල්ල බෙදා වෙන්කර ඇති සහාධිපත්‍ය කොටස් හඳුනාගත යුතු අතර වරිපනම් අංක, අංක හෝ වෙනත් සලකුණු මගින් එම කොටස් වෙන්කොට දැක්විය යුතු ය ;

(උ) සහාධිපත්‍ය දේපළේ ඉඩම් කොටස් අංකයට අදාළව හඳුනා ගැනීමේ ප්‍රලේඛන අකුරක් මගින් එක් එක් මහල වෙන්කොට දැක්විය යුතු අතර එක් එක් මහලේ අංකයට අදාළව ඒ මහලේ ඇති සහාධිපත්‍ය කොටස් දැක්විය යුතු ය ;

(ඌ) එක් එක් සහාධිපත්‍ය කොටසේ ආසන්නතම බිම් ප්‍රමාණය පෙන්විය යුතු ය ;

(එ) ගොඩනැගිලි සැලසුම් අනුමත කිරීම සඳහා තත්කාලයෙහි බලය දරන බලධරයා විසින් අනුමත කරනු ලැබූ ගොඩනැගිලි සැලසුම් සහ නැවත බෙදා වෙන්කළ සැලසුම්වලට අනුකූලව සම්පූර්ණ කරන ලද නැවත බෙදා වෙන්කළ ගොඩනැගිල්ලක් ලෙස සහාධිපත්‍ය දේපළ ඇතුළත ඉදිකරනු ලැබූ එක් එක් ගොඩනැගිල්ලේ යම් දිගාංශයක් පෙන්වීමේ අවශ්‍යතාවක් නොමැතිව, බාහිර මායිම් රූප රේඛනය කොට ඒවායේ තිරස් දිග, පළල පෙන්නුම් කළ යුතු ය ;

(ඒ) සහාධිපත්‍ය දේපළේ පොදු අංගෝපාංග නිර්ණය කළ යුතු ය ;

(ඔ) සහාධිපත්‍ය දේපළෙහි පෙන්නුම් කර ඇති ගොඩනැගිල්ල සහාධිපත්‍ය දේපළේ බාහිර තිරස් මායිම් ඇතුළත පිහිටා ඇති බවට එය පිළියෙල කරන තැනැත්තා විසින් කරනු ලබන සටහනක් තිබිය යුතු ය ;

(ඹ) එහි පෙන්වා ඇති සහාධිපත්‍ය කොටස්, සහාධිපත්‍ය දේපළ මත පිහිටා ඇති සහාධිපත්‍ය කොටස්ම බවට ලියාපදිංචි වාස්තු විද්‍යාඥයකු හෝ ලියාපදිංචි වෘත්තියමය සිවිල් ව්‍යුහ ඉංජිනේරුවකු විසින් නිකුත් කරනු ලබන සහතිකයක් එයට අමුණා තිබිය යුතු ය ;

(ක) 20අ වගන්තියේ විධිවිධානවලට අනුකූලව සැලැස්මෙහි ඇති එක් එක් සහාධිපත්‍ය කොටසේ හිමිකම් වටිනාකම ඇතුළත් කළ යුතු ය ;

(ග) සහාධිපත්‍ය දේපළේ බාහිර මතුපිට මායිම්වලට අදාළව සහාධිපත්‍ය පිඹුරෙහි පෙන්නුම් කර ඇති සියලු ගොඩනැගිලි සහ සියලු සහාධිපත්‍ය කොටස් සහාධිපත්‍ය දේපළ ඇතුළත පිහිටා ඇති බවට ද ගොඩනැගිලි සැලසුම් අනුමත කිරීම සඳහා වගකිව යුතු අධිකාරිය විසින් නිකුත් කරනු ලැබූ ගොඩනැගිලි සැලසුම් සහ උප බෙදීමේ සැලසුම්වලට අනුකූල වන බවට ද බලයලත් මිනින්දෝරුවරයකු විසින් නිකුත් කරනු ලැබූ සහතිකයක් මගින් කරන ලද සටහනක් තිබිය යුතු ය :

(ච) එක් එක් සහාධිපත්‍ය කොටසේ හිමිකම් වටිනාකම සම්පූර්ණ සංඛ්‍යාවලින් ද සියලුම සහාධිපත්‍ය කොටස්වල මුළු හිමිකම් වටිනාකමේ අයිතිය සමාන සංඛ්‍යාවක් ද පෙන්නුම් කළ යුතු ය.

(ජ) 20ග වගන්තියට අනුකූලව කළමනාකාර සංස්ථාව වෙත ලේඛන භාර දිය හැකි ලිපිනය එහි සටහන් කර තිබිය යුතු ය ; සහ

(ට) නියම කරනු ලැබිය හැකි වෙනත් යම් තොරතුරු ඇතුළත් විය යුතු ය.

(2) උපකාරක කොටසක ගොඩනැගිල්ලකින් සහ බාහිර බිත්ති කිපයකින්, බිමකින් සහ සිවිලිමකින් සමන්විත වන අවස්ථාවක ඒ උපකාරක කොටසේ දිග, පළල සහ මායිම් (1) වන උප වගන්තියේ නියමයන්ට අනුකූලව සහාධිපත්‍ය පිඹුරේ පෙන්නුම් කළ යුතු ය.

(3) උපකාරක කොටසක් ගොඩනැගිල්ලකින් සමන්විත නොවන අවස්ථාවක---

(අ) ගොඩනැගිලි සැලසුම් සහ නැවත බෙදන ලද සැලසුම් අනුමත කිරීම සඳහා තත් කාලයෙහි වගකිවයුතු අධිකාරිය විසින් අනුමත කරන ලද ගොඩනැගිලි සැලසුම් සහ නැවත බෙදන ලද සැලසුම්වලින් උපකාරක කොටස්වල බාහිර මායිම් දැනගත යුතු අතර, සහාධිපත්‍ය දේපළේ වෙනත් කොටසක් මගින් බිම් මට්ටමට ඉහතින් වූ යම් දීර්ඝ කිරීමකට හෝ බිම් මට්ටමකට පහලින් වූ ප්‍රසර්පණයක ප්‍රමාණයට හැර උපකාරක කොටසේ සිරස් දිග පළල සීමා රහිත විය යුතු ය ; සහ

(ආ) සහාධිපත්‍ය පිඹුරෙහි, (අ) ඡේදයෙහි සඳහන් අනුමත සැලසුම් මත පෙන්වා ඇති සමාන දිග පළල ඇති උපකාරක කොටස්වල රූප සටහන් පෙන්නුම් කළ යුතු ය.

(4) සහාධිපත්‍ය පිඹුරෙහි අන්‍යාකාරයකින් නියම කර ඇත්නම් මිස, වෙනත් සහාධිපත්‍ය කොටසක හෝ පොදු අංගෝපාංගයක් සමග ගත් කල යම් සහාධිපත්‍ය පිඹුරක හෝ මායිම් විය යුත්තේ අවස්ථාවෝචිත පරිදි බිම් ප්‍රමාණයේ, බිත්තිවල හෝ සිවිලිමේ මධ්‍යස්ථානයේ ය.".

ප්‍රධාන ප්‍රඥප්තියට අලුතින් 5අ සහ 5ආ යන වගන්ති ඇතුළත් කිරීම.

**7.** ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තියට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් වගන්ති මෙයින් ඇතුළත් කරනු ලබන අතර, ඒවා ඒ ප්‍රඥප්තියේ 5අ සහ 5ආ, වගන්ති ලෙස බලාත්මක විය යුතු ය :—

'තාවකාලික සහාධිපත්‍ය පිඹුර.

5අ. තාවකාලික සහාධිපත්‍ය පිඹුර බලයලත් මිනින්දෝරුවරයකු විසින් හෝ සර්වේයර් ජනරාල්වරයා විසින් හෝ ඔහුගේ බලය යටතේ සකස් කොට අඳිනු ලැබිය යුතු අතර එම සැලැස්මට පහත සඳහන් දේ ඇතුළත් විය යුතු ය :–

(අ) යෝජිත සහාධිපත්‍ය දේපළෙහි බාහිර මතුපිට මායිම් සහ මායිම් සලකුණු රූපරේඛනය කළ යුතු අතර, මතුපිට මායිම්වලට අදාළව එය මත ඉදිකිරීමට අපේක්ෂිත එක් එක් නැවත බෙදන ලද ගොඩනැගිල්ලේ තත්ත්වය ;

(ආ) ඉඩම් කොටස ලියාපදිංචි කර ඇති කොට්ඨාසය, වෙළුම සහ පත් ඉරුව සහ එහි මනින ලද ප්‍රදේශය දැක්විය යුතු ය ;

(ඇ) (i) එක් එක් මහලේ බිම් ප්‍රමාණ සහ සිලිම ද ; සහ

(ii) එක් එක් වහලේ උස,

පෙන්නුම් කරමින් ඉදිකිරීමට යෝජිත එක් එක් නැවත බෙදන ලද ගොඩනැගිල්ලේ තිරස් කොටසක් විය යුතු ය ;

(ඈ) ගොඩනැගිලි අනුමත කිරීම සඳහා වගකිව යුතු තත් කාලය සඳහා වූ අධිකාරිය විසින් අනුමත කරනු ලැබූ ගොඩනැගිලි සැලැස්මට අනුකූලව ඉඩම් කොටස ඇතුළත ඉදිකිරීමට යෝජිත එක් එක් ගොඩනැගිල්ලේ විස්තරයක් සහ ඒ ගොඩනැගිල්ලේ සිරස් කොටසක් සහ දිග පළල ;

(ඉ) 5 වන වගන්තියේ (2) සහ (3) උපවගන්තිවල විධිවිධානවලට යටත්ව එක් එක් යෝජිත සහාධිපත්‍ය කොටස ආලේඛනය කළ යුතු අතර, යම් පිහිටීමේ ස්වභාවය පෙන්නුම් කිරීමක් නොමැතිව දිග සහ පළල නිසා පෙන්නුම් කරමින් බිම් ප්‍රමාණය සහ බිත්තින් පිළිබඳව සඳහන් කරමින් එහි මායිම් නිර්ණය කළ යුතු ය ;

(ඊ) එක් එක් යෝජිත සහාධිපත්‍ය කොටස් හඳුනාගත යුතු අතර, වරිපනම් අංක වලින්, අංක වලින් හෝ වෙනත් සංකේත වලින් එම කොටස් පැහැදිලිව පෙන්නුම් කළ යුතු ය ;

(උ) කැඩස්තර සිතියමේ ඉඩම් කොටස් අංකයට අදාළව හඳුනාගැනීමේ අකුරක් මගින් එක් එක් යෝජිත මහල වෙන් වශයෙන් හඳුනාගත යුතු අතර, එක් එක් මහලේ අංකයට අදාළ එක් එක් මහලේ පිහිටි යෝජිත සහාධිපත්‍ය කොටස නිශ්චිතව දක්වනු ලැබිය යුතු ය ;

(ඌ) එක් එක් යෝජිත කොටසේ ආසන්නතම බිම් ප්‍රමාණය දැක්වීම කළ යුතු ය ;

(එ) ගොඩනැගිලි සැලසුම් අනුමත කිරීම සඳහා තත් කාලයෙහි වගකිව යුතු අධිකාරිය විසින් අනුමත කරන ලද ගොඩනැගිලි සැලැස්මට අනුකූලව ඉඩම් කොටස ඇතුළත ඉදිකිරීමට යෝජිත එක් එක් ගොඩනැගිල්ලේ පිහිටීම පෙන්නුම් කිරීමේ අවශ්‍යතාවක් නොමැතිව බාහිර මායිම් ආලේඛනය කොට තිරස් මිමි පෙන්නුම් කළ යුතු ය :

(ඒ) තාවකාලික සහාධිපත්‍ය දේපළින් තාවකාලික පොදු අංගෝපාංග නිර්ණය කළ යුතු ය ;

(ඔ) එක් එක් යෝජිත සහාධිපත්‍ය පිඹුරේ තාවකාලික හිමිකම් වටිනාකම් සම්පූර්ණ අංකවලින් පෙන්නුම් කළ යුතු අතර, සියලුම යෝජිත සහාධිපත්‍ය කොටස්වල තාවකාලික හිමිකම් වටිනාකම්වල මුළු එකතුව සමාන අංකවලින් ද පෙන්නුම් කළ යුතු ය ;

(ඕ) තාවකාලික සහාධිපත්‍ය පිඹුරේ පෙන්නුම් කර ඇති ඉදිකිරීමට යෝජිත ගොඩනැගිල්ල ගොඩනැගිලි සැලැස්ම අනුමත කිරීම සඳහා තත් කාලයේ බලය දරන බලධරයා විසින් අනුමත කරනු ලබන ගොඩනැගිලි සැලැස්මට අනුකූල වන බවට එකී සැලැස්ම පිළියෙල කළ තැනැත්තා විසින් සටහනක් කර තිබිය යුතු ය.

අර්ධ සහාධිපත්‍ය පිඹුර.

5ආ. (1) "අර්ධ සහාධිපත්‍ය පිඹුරක්" බලයලත් මිනින්දෝරුවරයකු විසින් හෝ සර්වේයර් ජනරාල්වරයා විසින් හෝ ඔහුගේ බලය යටතේ සකස් කොට ඇඳිය යුතු අතර, එම පිඹුරෙහි පහත සඳහන් දේ ඇතුළත් විය යුතු ය :–

(අ) අර්ධ සහාධිපත්‍ය දේපළෙහි බාහිර භූතල මායිම් සහ මායිම් සළකුණු ද, භූතල මායිම්වලට අදාළව ඒ මත පිහිටා ඇති එක් එක් අර්ධ වශයෙන් සම්පූර්ණ කළ නැවත බෙදා වෙන් කළ ගොඩනැගිල්ලේ පිහිටීම ද භූතල මායිම්වලට අදාළව ගොඩනැගිලි සැලසුම් අනුමත කිරීම සඳහා වන අධිකාරිය විසින් අනුමත කරන ලද ගොඩනැගිලි සැලැස්මට අනුකූලව සම්පූර්ණ කිරීමට ඇති ගොඩනැගිල්ලේ ඉතිරි කොටසේ පිහිටීම ද ආලේඛනය කිරීම ;

(ආ) ඉඩම් කොටස ලියාපදිංචි කර ඇති කොට්ඨාසය, වෙළුම, සහ පිටුව සහ එහි මනින ලද ප්‍රදේශය නිශ්චිතව දැක්වීම ;

(ඈ) (i) එක් එක් මහලේ ගෙබිම සහ සිලිම ; සහ

(ii) එක් එක් මහලේ උස පෙන්නුම් කරමින් එක් එක් අර්ධ වශයෙන් සම්පූර්ණ කරන ලද නැවත බෙදා වෙන්කළ ගොඩනැගිල්ලේ සිරස් කඩක් ;

(ඈ) ගොඩනැගිලි සැලසුම් අනුමත කිරීම සඳහා තත් කාලයේ බලය දරන බලධරයා විසින් අනුමත කරන ලද ගොඩනැගිලි සැලැස්මට අනුකූලව ඉඩම් කොටසෙහි ඉදිකරන ලද අර්ධ වශයෙන් සම්පූර්ණ කළ ගොඩනැගිල්ලේ විස්තරයක් සහ එහි සිරස් කඩක් සහ දිග පළල ද එසේ ම එම ඉඩම් කොටස මත ඉදිකිරීම් සම්පූර්ණ කිරීමට ඇති ගොඩනැගිල්ලේ ඉතිරි කොටසේ සිරස් කඩක් සහ දිග පළල ද ඇතුළත් කළ යුතු ය. ;

(ඉ) 5 වන වගන්තියේ, (2) සහ (3) උපවගන්තිවල විධිවිධානවලට යටත්ව අර්ධ වශයෙන් සම්පූර්ණ කරන ලද ගොඩනැගිල්ලේ එක් එක්. සහාධිපත්‍ය කොටස් රූප රේඛනය කළයුතු අතර යම් දිගාංශයන් පෙන්වීමේ අවශ්‍යතාවක් නොමැතිව තිරස් මාන දැක්වෙන පරිදි ගෙබිම සහ බිත්තිවලට අනුව එහි මායිම් නිර්ණය කිරීම ;

(ඊ) එක් එක් ගොඩනැගිල්ල බෙදා වෙන් කිරීමට අදහස් කරනු ලබන අර්ධ වශයෙන් සම්පූර්ණ කළ ගොඩනැගිල්ලේ සහාධිපත්‍ය කොටස් හඳුනාගැනීම සහ වරිපනම් අංකවලින්, අංකවලින් හෝ වෙනත් සළකුණුවලින් එක් එක් කොටස වෙන් වශයෙන් හඳුනාගැනීම ;

(ඪ) කැඩස්තර සිතියමේ ඉඩම් කොටස් අංකයට අදාළව හඳුනාගැනීමේ අකුරක් මගින් එක් එක් මහල වෙන් වශයෙන් හඳුනාගැනීම සහ එම මහලේ අංකයට අදාළව එක් එක් මහලෙන් අර්ධ වශයෙන් සම්පූර්ණ කළ ගොඩනැගිල්ලේ සහාධිපත්‍ය කොටස නිශ්චිතව දැක්වීම ;

(ඌ) එක් එක් කොටසේ ආසන්නතම බිම් ප්‍රමාණය දැක්වීම ;

(එ) ගොඩනැගිලි සැලසුම් අනුමත කිරීම සඳහා තත් කාලයේ වගකිවයුතු අධිකාරිය විසින් අනුමත කරන ලද ගොඩනැගිලි සැලැස්මට අනුකූලව ඉඩම් කොටස ඇතුළත ද ඉදිකරන ලද එක් එක් අර්ධ වශයෙන් සම්පූර්ණ කළ ගොඩනැගිල්ලේ පිහිටීම පෙන්නුම් කිරීමේ අවශ්‍යතාවක් නොමැතිව බාහිර මායිම් ආලේඛනය කිරීම සහ තිරස් දිග පළල පෙන්නුම් කිරීම ;

(ඒ) අර්ධ සහාධිපත්‍ය දේපළෙහි පොදු අංගෝපාංග නිර්ණය කිරීම ;

(ඔ) අර්ධ වශයෙන් සම්පූර්ණ කළ ගොඩනැගිල්ලේ එක් එක් සහාධිපත්‍ය කොටසේ සහ ඉදිකිරීම් කටයුතු සම්පූර්ණ කිරීමට ඇති ගොඩනැගිල්ලේ ඉතිරි කොටසෙහි එක් එක් තාවකාලික සහාධිපත්‍ය කොටසේ සම්පූර්ණ සංඛ්‍යාවල හිමිකම් වටිනාකම පෙන්වීම සහ සියලුම සහාධිපත්‍ය කොටස්වල සහ එක් එක් සහාධිපත්‍ය කොටසේ හිමිකම්, වටිනාකම්වල මුළු එකතුවට සමාන අංකයක් ද පෙන්නුම් කිරීම;

(ඕ) අර්ධ සහාධිපත්‍ය පිඹුරේ පෙන්නුම්කර ඇති අර්ධ වශයෙන් සම්පූර්ණ කළ ගොඩනැගිල්ලේ ගොඩනැගිලි සැලැස්ම අනුමත කිරීම සඳහා තත්කාලයේ බලය

දරන බලධරයා විසින් අනුමත කරනු ලබන ගොඩනැගිලි සැලැස්මට අනුකූල බව එකී සැලැස්ම පිළියෙලකළ තැනැත්තා විසින් සටහනක් කර තිබිය යුතු ය.''.

*ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.*

**8.** ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :–

*'සහාධිපත්‍ය පිඹුරු, ඒකාබද්ධ කිරීමේ, හෝ නැවත බෙදා වෙන් කිරීමේ පිඹුරු ලියාපදිංචි කිරීම සහ එය ප්‍රතික්ෂේප කරනු ලැබීමට විරුද්ධ අභියාචනා.*

6 (1) සහාධිපත්‍ය පිඹුරක් හෝ ''තාවකාලික සහාධිපත්‍ය පිඹුරක්'' හෝ ''අර්ධ සහාධිපත්‍ය පිඹුරක්'' ලියාපදිංචි කිරීම සඳහා වන කිසියම් ඉල්ලීමක් හෝ සංශෝධන පිඹුරක් ලියාපදිංචි කිරීම සඳහා වන කිසියම් ඉල්ලීමක් හෝ සංශෝධන පිඹුරක් ලියාපදිංචි කිරීම සඳහා 8 වන වගන්තිය යටතේ වන යම් ඉල්ලීමක් හෝ සංශෝධන පිඹුරක් ලියාපදිංචි කිරීම සඳහා 8ආ වගන්තිය යටතේ වන යම් ඉල්ලීමක් හෝ නැවත බෙදන ලද පිඹුරක් හෝ ඒකාබද්ධ කිරීමේ පිඹුරක් ලියාපදිංචි කිරීම සඳහා 12 වන වගන්තිය යටතේ වන යම් ඉල්ලීමක් හෝ ''සංකලන පිඹුරක් ලියාපදිංචි කිරීම සඳහා 8ඇ වගන්තිය යටතේ වන යම් ඉල්ලීමක් ලැබීමෙන් පසු, රෙජිස්ට්‍රාර් විසින්, අවස්ථාවෝචිත පරිදි, සහාධිපත්‍ය පිඹුර හෝ තාවකාලික සහාධිපත්‍ය පිඹුරක් හෝ අර්ධ සහාධිපත්‍ය පිඹුර හෝ සංශෝධන පිඹුර හෝ නැවත බෙදන ලද පිඹුර හෝ ඒකාබද්ධ කිරීමේ පිඹුර හෝ සංකලන පිඹුර ඇතුළුව ඒ ඉල්ලීම හා කැඩැස්තර සිතියම සහතික කිරීම සඳහා මිනින්දෝරුවරයා වෙත යොමු කළ යුතු ය.

(2) අවස්ථාවෝචිත පරිදි, සහාධිපත්‍ය පිඹුර හෝ තාවකාලික පිඹුර හෝ අර්ධ සහාධිපත්‍ය පිඹුර හෝ සංශෝධන පිඹුර හෝ නැවත බෙදන ලද පිඹුර හෝ ඒකාබද්ධ කිරීමේ පිඹුර හෝ සංකලන පිඹුර මේ පනතේ විධිවිධානවලට හා 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ විධිවිධානවලට අනුකූල වන බවට මිනින්දෝරුවරයා සෑහීමට පත්වන අවස්ථාවක, සර්වේයර් ජනරාල්වරයා වෙනුවට ඒ පිඹුර ඔහු විසින් සහතික කරනු ලැබිය යුතු අතර –

(අ) හිමිකම් ලියාපදිංචි කිරීම සඳහා භාවිත වන කැඩැස්තර සිතියමට අනුව, පුද්ගල සඳහන් කිරීම් දැක්වීමෙන් පසුව හා

අවශ්‍ය සංශෝධන හෝ වෙනස් කිරීම් හෝ අතුරු බෙදීම් හෝ ඒකාබද්ධ කිරීම් හෝ සංයුක්ත කිරීම් වලින් පසුව අවස්ථාවෝචිත පරිදි සහාධිපත්‍ය පිඹුරු හෝ තාවකාලික සහාධිපත්‍ය පිඹුරු හෝ අර්ධ සහාධිපත්‍ය පිඹුරු හෝ සංශෝධන පිඹුරු හෝ නැවත බෙදන ලද පිඹුරු හෝ ඒකාබද්ධ කිරීමේ පිඹුරු හෝ සංකලන පිඹුරු මුල් පිටපත් ගොනු කළ යුතු ය ; සහ

(ආ) අවස්ථාවෝචිත පරිදි, අවශ්‍ය සඳහන් කිරීම් හෝ සංශෝධන නැතහොත් අතුරු බෙදීම් හෝ ඒකාබද්ධ කිරීම් සිදුකිරීමෙන් පසුව කැඩැස්තර සිතියම සමග ඒ පිඹුරේ සහ ඉල්ලීමේ අනු පිටපත් නිසි රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

(3) මිනින්දෝරුවරයා විසින් නිසි ලෙස සහතික කරන ලද කැඩැස්තර සිතියමක් ලැබීමෙන් පසු, ඒ ඉල්ලීම මේ පනතේ විධිවිධානවලට සහ 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ විධිවිධානවලට අනුකූලව වන බවට රෙජිස්ට්‍රාර්වරයා සෑහීමට පත්වන්නේ නම්, ඔහු විසින් –

(අ) ඉල්ලීම, සහාධිපත්‍ය පිඹුරක් ලියාපදිංචි කිරීම සඳහා වන අවස්ථාවක දී, –

(i) සහාධිපත්‍ය පිඹුරේ අනුපිටපත සහාධිපත්‍ය කොටස් ගොනුවේ ගොනු කළ යුතු ය ;

(ii) සහාධිපත්‍ය පිඹුරේ දක්වා ඇති එක් එක් සහාධිපත්‍ය කොටස් සම්බන්ධයෙන් අලුත් හිමිකම් නාම ලේඛන ගොනුවක් විවෘත කළ යුතු අතර එම නාම ලේඛනයේ සහ ඉඩම් කොටස් ලියාපදිංචි කර

ඇත්තා වූ නාම ලේඛනයේ හා තාවකාලික සහාධිපත්‍ය පිඹුර හෝ අර්ධ සහාධිපත්‍ය පිඹුර මීට පෙර ලියාපදිංචි කර තිබෙන්නේ නම් එම තාවකාලික සහාධිපත්‍ය පිඹුර හෝ අර්ධ සහාධිපත්‍ය පිඹුර ලියාපදිංචි කර ඇත්තා වූ නාම ලේඛනයේ සුදුසු හරස් විමසුම් යොමු සටහන් යෙදිය යුතු ය ;

(iii) නාමලේඛනයේ ඇතුළත් වන ඉඩම්වල පොදු දේපළ පමණක් අඩංගු වන බව, ඉඩම් කොටසට අදාළ වන්නා වූ නාමලේඛනයේ දේපළ කොටසේ සටහන් කළ යුතු ය ;

(iv) එක් එක් සහාධිපත්‍ය කොටස් අරභයා පවතින උකස් කිරීම් සහ ඒ මත ලබාගත් මුදල් ප්‍රමාණයන් සහ බදු දීම්, විකිණීම සඳහා වූ ගිවිසුම් විනිශ්චයට භාජනයවීම, තහනමට ගැනීමක්, නියෝගයක් හෝ තීන්දු ප්‍රකාශයක් ආදී ලෙසින් සහාධිපත්‍ය කොටස්වලට බලපාන කිසිවක් වේ නම් ඒ සියලු බැඳීම් පිළිබඳ විස්තර සහාධිපත්‍ය පිඹුරේ දක්වා ඇති එවැනි එක් එක් සහාධිපත්‍ය කොටස් සම්බන්ධයෙන් වූ නාම ලේඛනයේ බැඳුම් සහතික පත්‍ර කොටසේ සටහන් කළ යුතු ය ;

(v) (මෙහි මින් මතු, "ලියාපදිංචි කළ සහාධිපත්‍ය පිඹුර යනුවෙන් සඳහන් කරනු ලබන) එම සහාධිපත්‍ය පිඹුර ලියාපදිංචි කර ඇති බවට ඉල්ලුම්කරු වෙත දැනුම් දිය යුතු අතර, සහාධිපත්‍ය කළමනාකරණ

අධිකාරිය වෙත වූ නිවේදනයක් සමග අදාළ නාම ලේඛනවල යොමු අංක පිළිබඳව ද ඉල්ලුම්කරුට දැන්විය යුතු ය ;

(vi) නියමිත ගාස්තු ලැබුන පසු තනි පුද්ගලික සහාධිපත්‍ය කොටසක් සම්බන්ධයෙන් "සහාධිපත්‍ය හිමිකම්" සහතිකයක් නිකුත් කළ යුතු ය.

(ආ) ඉල්ලීම, තාවකාලික සහාධිපත්‍ය පිඹුරක් ලියාපදිංචි කිරීම සඳහා වන අවස්ථාවක දී, -

(i) තාවකාලික සහාධිපත්‍ය පිඹුරේ අනුපිටපත තාවකාලික සහාධිපත්‍ය කොටස් ගොනුවේ ගොනු කළ යුතු ය ;

(ii) තාවකාලික සහාධිපත්‍ය පිඹුරක දක්වා ඇති එක් එක් තාවකාලික සහාධිපත්‍ය කොටස් සම්බන්ධයෙන් වූ නාමලේඛනය තුළ අලුත් තාවකාලික හිමිකම් නාමලේඛන ගොනුවක් විවෘත කළ යුතු අතර ඒ ඉඩම් කොටස් ලියාපදිංචි කර තිබෙන්නා වූ නාමලේඛනය තුළ වූ එම නාමලේඛනයේ සුදුසු හරස් විමසුම් යොමු සටහන් යෙදිය යුතු ය ;

(iii) නාමලේඛනයේ ඇතුළත්වන ඉඩම්වල පොදු දේපළ පමණක් අඩංගු වන බව, ඉඩම් කොටසට අදාළ වන්නා වූ නාම ලේඛනයේ දේපළ කොටසේ සටහන් කළ යුතු ය ;

(iv) එක් එක් සහාධිපත්‍ය කොටස් අරබයා පවතින උකස් කිරීම් සහ ඒ මත ලබාගත් මුදල් ප්‍රමාණයන් සහ බද්දීම්, විකිණීම සඳහා වූ ගිවිසුම්, විනිශ්චයට භාජනයවීම

තහනමට ගැනීමක්, නියෝගයක් හෝ තීන්දු ප්‍රකාශයක් ආදි ලෙසින් සහාධිපත්‍ය කොටස්වලට බලපාන කිසිවක් වේ නම් ඒ සියලු බැඳීම් පිළිබඳ විස්තර එක් එක් තාවකාලික සහාධිපත්‍ය කොටස් සම්බන්ධයෙන් වූ නාමලේඛනයේ බැඳුම් සහතික පත්‍ර කොටසේ සටහන් කළ යුතු ය ;

(v) (මෙහි මින් මතු ලියාපදිංචි කළ තාවකාලික සහාධිපත්‍ය පිඹුර යනුවෙන් සඳහන් කරනු ලබන) එම තාවකාලික සහාධිපත්‍ය පිඹුර ලියාපදිංචි කර ඇති බවට ඉල්ලුම්කරු වෙත දැනුම් දිය යුතු අතර සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය වෙත වූ නිවේදනයක් සමග අදාළ නාම ලේඛනවල යොමු අංක පිළිබඳව ද ඉල්ලුම්කරුට දැන්විය යුතු ය ;

(vi) නියමිත ගාස්තු ලැබුන පසු පුද්ගලික තාවකාලික සහාධිපත්‍ය හිමිකම් සහතිකයක් නිකුත් කළ යුතු ය.

(ඇ) ඉල්ලීමක්, අර්ධ සහාධිපත්‍ය පිඹුරක් ලියාපදිංචි කිරීම සඳහා වන අවස්ථාවක දී :–

(i) අර්ධ සහාධිපත්‍ය අනු පිටපත අර්ධ සහාධිපත්‍ය කොටස් ගොනුවේ ගොනු කළ යුතු ය ;

(ii) අර්ධ සහාධිපත්‍ය පිඹුරේ දක්වා ඇති එක් එක් සහාධිපත්‍ය කොටස් සම්බන්ධයෙන් වූ නාමලේඛනයේ අලුත් හිමිකම් නාමලේඛන ගොනුවක් විවෘත කළ යුතු අතර එම නාමලේඛනයේ සහ ඉඩම් කොටස් ලියාපදිංචි කර තිබෙන්නා වූ නාමලේඛනයේ හා තාවකාලික

සහාධිපත්‍ය පිඹුර මීට පෙර ලියාපදිංචි කර තිබෙන්නේ නම් ඒ තාවකාලික සහාධිපත්‍ය පිඹුර ලියාපදිංචි කර තිබෙන්නා වූ නාම ලේඛනයේ සුදුසු හරස් විමසීම් යොමු සටහන් යෙදිය යුතු ය ;

(iii) නාම ලේඛනයේ ඇතුළත් වන ඉඩම්වල පොදු දේපළ පමණක් අඩංගු වන බව ඉඩම් කොටසට අදාළ වන්නා වූ නාම ලේඛනයේ දේපළ කොටසේ සටහන් කළ යුතු ය ;

(iv) එක් එක් සහාධිපත්‍ය කොටස් අරබයා පවතින උකස් කිරීම් සහ ඒ මත ලබාගත් මුදල් ප්‍රමාණයන් සහ බදුදීම්, විකිණීම සඳහා වූ ගිවිසුම් විනිශ්චයට භාජනයවීම, තහනමට ගැනීමක්, නියෝගයන් හෝ තීන්දු ප්‍රකාශයන් ආදී ලෙසින් සහාධිපත්‍ය කොටස්වලට බලපාන කිසිවක් වේ නම් ඒ සියලු බැඳීම් පිළිබඳ විස්තර අර්ධ සහාධිපත්‍ය පිඹුරේ දක්වා ඇති එක් එක් සහාධිපත්‍ය කොටස් සම්බන්ධයෙන් වූ නාම ලේඛනයේ බැඳුම් සහතික පත්‍ර කොටසේ සටහන් කළ යුතු ය ;

(v) (මෙහි මින් මතු "ලියාපදිංචි කළ අර්ධ සහාධිපත්‍ය පිඹුර යනුවෙන් සඳහන් කරනු ලබන) ඒ අර්ධ සහාධිපත්‍ය පිඹුර ලියාපදිංචි කර ඇති බවට එහි ඉල්ලුම්කරු වෙත දැනුම් දිය යුතු අතර සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය වෙත වූ නිවේදනයක් සමග අදාළ නාම ලේඛනවල යොමු අංක පිළිබඳව ද ඉල්ලුම්කරුට දැන්විය යුතු ය ;

(vi) නියමිත ගාස්තු ලැබුනු පසු නව පුද්ගලික සහාධිපත්‍ය කොටසක් සම්බන්ධයෙන් අර්ධ සහාධිපත්‍ය හිමිකම් සහතිකයක් නිකුත් කළ යුතු ය.

(ඈ) ඉල්ලීම, ලියාපදිංචි කරන ලද සහාධිපත්‍ය පිඹුරක හෝ ලියාපදිංචි කරන ලද අර්ධ සහාධිපත්‍ය පිඹුරක සංශෝධනය කිරීමේ යම් පිඹුරක් හෝ නැවත බෙදන ලද යම් පිඹුරක් හෝ ලියාපදිංචි කරන ලද සහාධිපත්‍ය පිඹුරක් හෝ ලියාපදිංචි කරන ලද අර්ධ සහාධිපත්‍ය පිඹුරක් ඒකාබද්ධ කිරීම සඳහා වන කිසියම් පිඹුරක්, ලියාපදිංචි කිරීම සඳහා වන අවස්ථාවක දී, -

(i) සංශෝධන පිඹුරේ හෝ නැවත බෙදන ලද පිඹුරේ හෝ ඒකාබද්ධ කිරීමේ පිඹුරේ අනු පිටපත් අදාළ සහාධිපත්‍ය කොටස් ගොනුවේ ගොනුකළ යුතු ය ;

(ii) ලියාපදිංචි කරන ලද සහාධිපත්‍ය පිඹුරේ හෝ ලියාපදිංචි කරන ලද අර්ධ සහාධිපත්‍ය පිඹුරේ දක්වා ඇති එක් එක් සහාධිපත්‍ය කොටස් සම්බන්ධයෙන් වන අවශ්‍ය සඳහන් කිරීම් නාම ලේඛනයේ සටහන් කළ යුතු අතර ලියාපදිංචි කරන ලද සහාධිපත්‍ය පිඹුරේ මුල් පිටපතේ හෝ ලියාපදිංචි කරන ලද අර්ධ සහාධිපත්‍ය පිඹුරේ මුල්පිටපතේ අවශ්‍ය යොමු සටහන් යෙදිය යුතු ය ;

(iii) ලියාපදිංචි කරන ලද සහාධිපත්‍ය පිඹුරක හෝ ලියාපදිංචි කරන ලද අර්ධ සහාධිපත්‍ය පිඹුරක ඇති එවැනි සංශෝධන හෝ නැවත බෙදීම් හෝ ඒකාබද්ධ කිරීම් ලියාපදිංචි කර තිබෙන්නා වූ බවට ඉල්ලුම්කරු වෙත දැනුම් දිය යුතු අතර සහාධිපත්‍ය

කළමනාකරණ අධිකාරිය වෙත වූ නිවේදනයක් සමග අදාළ නාම ලේඛනවල යොමු අංක පිළිබඳව ද ඉල්ලුම්කරුට දැන්විය යුතු ය ;

(iv) නියමිත ගාස්තු ලැබීමේ දී, තනි පුද්ගල සහාධිපත්‍ය කොටස් සම්බන්ධයෙන් නව්‍ය සහාධිපත්‍ය හිමිකම් සහතිකයක් නිකුත් කළ යුතු ය.

(ඉ) ඉල්ලුම් පත්‍රය, ලියාපදිංචි කරන ලද තාවකාලික සහාධිපත්‍ය පිඹුරක් සංශෝධනය කිරීමේ යම් පිඹුරක් ලියාපදිංචි කිරීම සඳහා ඉදිරිපත් කරනු ලබන අවස්ථාවක දී,—

(i) ලියාපදිංචි කරන ලද තවකාලික සහාධිපත්‍ය පිඹුරේ අනුපිටපතක් අදාළ තාවකාලික සහාධිපත්‍ය කොටස් ලිපි ගොනුවේ ගොනු කළ යුතු ය ;

(ii) ලියාපදිංචි කරන ලද තාවකාලික සහාධිපත්‍ය පිඹුරේ පෙන්නුම් කර ඇති එක් එක් තාවකාලික සහාධිපත්‍ය කොටස් සම්බන්ධයෙන් තාවකාලික සහාධිපත්‍ය හිමිකම් ලේඛනයේ අවශ්‍ය සටහන් කළ යුතු අතර ලියාපදිංචි කරන ලද තාවකාලික සහාධිපත්‍ය පිඹුරේ මුල්පිටපතේ අවශ්‍ය යොමු සටහන් ද කරනු ලැබිය යුතු ය ;

(iii) එක් එක් සංශෝධිත තාවකාලික සහාධිපත්‍ය කොටස් සම්බන්ධයෙන් සහාධිපත්‍ය කොටස්වලට බලපාන උකස් කිරීම් සහ එක් එක් සහාධිපත්‍ය කොටසට එරෙහිව ලබාගන්නා ලද මුදල් ප්‍රමාණයන් එසේම බදු, විකිණීම සඳහා වූ ගිවිසුම්,

විනිශ්චයට භාජනය වීම, තහනමට ගැනිමේ ආඥා හෝ තීන්දු ප්‍රකාශ ආදිය තිබේ නම් ලේඛනයේ බැඳීම් කොටසෙහි සටහන් කළ යුතු ය ;

(iv) ඉල්ලුම්කරුට ඒ ලියාපදිංචි කරන ලද තාවකාලික සහාධිපත්‍ය පිඹුරේ සංශෝධනය කිරීම ලියාපදිංචි කරනු ලැබ ඇති බව දැනුම් දිය යුතු අතර සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරියේ නිවේදනයක් ද සමග අදාළ ලේඛනයේ යොමු අංක පිළිබඳව ද ඉල්ලුම්කරුට දැනුම් දිය යුතු ය ;

(v) නියමිත ගාස්තු ගෙවීමේ දී, තනිපුද්ගල සහාධිපත්‍ය කොටස් සම්බන්ධයෙන් අලුත් සහාධිපත්‍ය හිමිකම් සහතිකයක් නිකුත් කළ යුතු ය.

(ඊ) ඉල්ලීම ලියාපදිංචි කරන ලද අර්ධ සහාධිපත්‍ය පිඹුරට එකතු කිරීමේ යම් පිඹුරක් ලියාපදිංචි කිරීම සඳහා වන අවස්ථාවක දී, –

(i) ලියාපදිංචි කරන ලද අර්ධ සහාධිපත්‍ය පිඹුරට එකතු කිරීමේ පිඹුරෙහි අනුපිටපතක් අදාළ සහාධිපත්‍ය කොටසේ ලිපිගොනුවෙහි ගොනු කරනු ලැබිය යුතු ය.

(ii) ලියාපදිංචි කරන ලද අර්ධ සහාධිපත්‍ය පිඹුරේ එකතු කිරීමේ පිඹුරේ පෙන්නුම් කර ඇති පසුව එකතු කරන ලද එක් එක් සහාධිපත්‍ය කොටස් සම්බන්ධයෙන් සහාධිපත්‍ය හිමිකම් ලේඛනයෙහි අවශ්‍ය සඳහන් කිරීම් කළ යුතු අතර ඉඩම් කොටස ලියාපදිංචි කර ඇති ලේඛනයෙහි සහ අර්ධ සහාධිපත්‍ය

පිඹුර හෝ තාවකාලික සහාධිපත්‍ය පිඹුර ලියාපදිංචි කරනු ලැබ ඇති ලේඛනවල අවශ්‍ය යොමු සටහන් කළ යුතු ය ;

(iii) ලියාපදිංචි අර්ධ සහාධිපත්‍ය පිඹුරේ එකතු කිරීමේ පිඹුරෙහි පෙන්නුම් කර ඇති පසුව එකතු කරන ලද එක් එක් සහාධිපත්‍ය කොටස සම්බන්ධයෙන් සහ එක් එක් සහාධිපත්‍ය කොටසට බලපාන උකස් කිරීමේ සහ එම සහාධිපත්‍ය කොටස්වලට එරෙහිව ලබාගත් මුදල් ප්‍රමාණයන් තිබීම පිළිබඳව ද, බදු දීම්, විකිණීම සඳහා ගිවිසුම්, විනිශ්චයට භාජනය වීම, තහනමට ගැනීමේ ආඥාවක් හෝ තීන්දු ප්‍රකාශයක් තිබීම පිළිබඳව ලේඛනයේ බැඳීම් කොටසෙහි සටහන් කළ යුතු ය ;

(iv) සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරියට ද පිටපතක් සහිතව, එකී සහාධිපත්‍ය කොටස් අර්ධ සහාධිපත්‍ය පිඹුරේ ලියාපදිංචි කර ඇති බවට ඉල්ලුම්කරුට දැන්විය යුතු ය ;

(v) නියමිත ගාස්තු ලැබුණු විට සහාධිපත්‍ය හිමිකම් සහතිකයක් එකී සහාධිපත්‍ය කොටස් සම්බන්ධයෙන් නිකුත් කළ යුතු ය.

(4) ඔප්පු ලියාපදිංචි කිරීම සහ කැඩැස්තර සිතියම් පරීක්ෂා කිරීම සහ ලේඛනවල සහ කැඩැස්තර සිතියම්වල සහතික පිටපත් නිකුත් කිරීම සහ සහාධිපත්‍ය කොටස හෝ කොටස්වල අයිතිවාසිකම් හෝ කැමති පත්‍රවල සහතික පත්‍ර ලබාගැනීම සඳහා අවශ්‍ය වෙනස් කිරීම් සහිතව 1998 අංක 21 දරන ඔප්පු ලියාපදිංචි කිරීමේ පනතේ 34, 35 සහ 37 වන වගන්ති යොදා ගනු ලැබිය යුතු ය.

(5) රෙජිස්ට්‍රාර්වරයා විසින් ''සහාධිපත්‍ය පිඹුර'' හෝ ''තාවකාලික සහාධිපත්‍ය පිඹුර'' හෝ ''අර්ධ සහාධිපත්‍ය පිඹුර'' හෝ ''සංශෝධිත පිඹුර'' හෝ ''වෙන් කිරීමේ පිඹුර'' හෝ ''ඒකාබද්ධ කිරීමේ පිඹුර'' හෝ ''එකතු කිරීමේ පිඹුර'' ලියාපදිංචි කිරීම ප්‍රතික්ෂේප කරනු ලබන අවස්ථාවක දී ඔහු විසින් ප්‍රතික්ෂේප කිරීමේ නියමයක් කරනු ලැබිය යුතු අතර ඒ ප්‍රතික්ෂේප කිරීමේ නියමය සඳහා වූ හේතු නියමිත ලේඛනයක වාර්තා කරනු ලැබ අවස්ථාවෝචිත පරිදි ''සහාධිපත්‍ය හිමිකම ලියාපදිංචි කිරීම ප්‍රතික්ෂේප කරන ලදී'' හෝ ''තාවකාලික සහාධිපත්‍ය හිමිකම ලියාපදිංචි කිරීම හෝ අර්ධ සහාධිපත්‍ය හිමිකම ලියාපදිංචි කිරීම ප්‍රතික්ෂේප කරන ලදී'' යන වචන සාධන පත්‍රවල සහ එවැනි ලියාපදිංචි කිරීමක් සඳහා ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කර කරනු ලබන තැනැත්තා විසින් කරනු ලබන ඒ ඉල්ලුම් පත්‍රය මත පිටසන් කරනු ලැබිය යුතු අතර එසේ වාර්තා කරනු ලබන හේතුවල පිටපතක් ඒ තැනැත්තා වෙත ගෙවීමකින් තොරව හෝ අනවශ්‍ය ප්‍රමාදයකින් තොරව ලබාදිය යුතු ය.

(6) සහාධිපත්‍ය පිඹුර හෝ තාවකාලික සහාධිපත්‍ය පිඹුර හෝ අර්ධ සහාධිපත්‍ය පිඹුර, හෝ සංශෝධිත පිඹුර හෝ වෙනස් කිරීමේ පිඹුර හෝ ඒකාබද්ධ කිරීමේ පිඹුර හෝ එකතු කිරීමේ පිඹුර ලියාපදිංචි කිරීම ප්‍රතික්ෂේප කරමින් රෙජිස්ට්‍රාර්වරයා විසින් කරනු ලබන සෑම නියමයක් ම සඳහා ම අභියාචනය කිරීමක් කරනු ලැබීමේ හැකියාවක් තිබිය යුතු අතර ලේඛන ලියාපදිංචි කිරීමේ ආඥා පනතේ 38 වන වගන්තියේ විධිවිධාන එවැනි අභියාචනයක් සම්බන්ධයෙන් අවශ්‍ය වෙනස්කම් සහිතව යොදාගනු ලැබිය යුතු ය.'.

**9.** ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :– ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

''සාධන පත්‍ර තබා ගැනීම සහ විනාශ කිරීම.

7. රෙජිස්ට්‍රාර්වරයා විසින් පිළිගනු ලැබූ සහ සහාධිපත්‍ය කොටස් ලිපිගොනුවේ හෝ තාවකාලික සහාධිපත්‍ය කොටස් ලිපි ගොනුවේ ගොනු කරනු ලැබූ සියලු සාධන පත්‍ර තබා ගැනීමට සහ විනාශ

කිරීමට 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ 53 වන වගන්තිය, අවශ්‍ය වෙනස්කම් සහිතව යොදගනු ලැබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 7අ වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

10. ප්‍රධාන ප්‍රඥප්තියේ 7අ වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :-

"සහාධිපත්‍ය දේපළ තාවකාලික සහාධිපත්‍ය දේපළ සහ අර්ධ සහාධිපත්‍ය දේපළ ලියාපදිංචි කිරීම.

7අ. (1) අවස්ථාවෝචිත පරිදි, සහාධිපත්‍ය පිඹුර හෝ තාවකාලික සහාධිපත්‍ය පිඹුර හෝ අර්ධ සහාධිපත්‍ය පිඹුර, සහාධිපත්‍ය දේපළේ හෝ තාවකාලික සහාධිපත්‍ය දේපළේ හෝ අර්ධ සහාධිපත්‍ය දේපළේ අයිතිකරු විසින් ඉල්ලුම් පත්‍රය ලියාපදිංචි කිරීම සඳහා ඉදිරිපත් කර ඇති විට ඒ ඉල්ලුම් පත්‍රය රෙජිස්ට්‍රාර්වරයා විසින් අත්සන් කරනු ලැබ සහ මුද්‍රා තබනු ලැබ ඇති විට සහ සියලු අදාළ හිමිකම් ලේඛන යථා පරිදි සකස් කරනු ලැබ ඇති විට, මේ පනතේ විධිවිධාන යටතේ ලියාපදිංචි කරනු ලැබ ඇති ලෙස සලකනු ලැබිය යුතු ය.

(2) අවස්ථාවෝචිත පරිදි සහාධිපත්‍ය පිඹුර හෝ තාවකාලික සහාධිපත්‍ය පිඹුර හෝ අර්ධ සහාධිපත්‍ය පිඹුර ලියාපදිංචි කිරීමේ දී, සහාධිපත්‍ය දේපළේ සහාධිපත්‍ය කොටසේ අයිතිකරු හෝ තාවකාලික සහාධිපත්‍ය දේපළේ තාවකාලික සහාධිපත්‍ය කොටසේ අයිතිකරු විසින් අදාළ ලේඛනයේ බැඳීම් ලියාපදිංචි කර ඇත්නම් හෝ සටහන් කර ඇත්නම් ඒ බැඳීම්වලට යටත්ව ඔහුගේ පොදු කොටස් හෝ තාවකාලික පොදු කොටස්වල තමාගේ පංගුවේ අයිතිකරු ලෙස සලකනු ලැබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

11. ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :—

"සභාධිපත්‍ය පිඹුර හෝ අර්ධ සභාධිපත්‍ය පිඹුර සංශෝධනය කිරීම.

8. (1) ලියාපදිංචි කරන ලද සභාධිපත්‍ය දේපළක හෝ ලියාපදිංචි කරන ලද අර්ධ සභාධිපත්‍ය දේපළක යම් සභාධිපත්‍ය කොටසක අයිතිකරු විසින්, ලියාපදිංචි කරන ලද සභාධිපත්‍ය පිඹුර හෝ ලියාපදිංචි කරන ලද අර්ධ සභාධිපත්‍ය පිඹුර සංශෝධනය කරනු ලැබුවා වූ පිඹුර ලියාපදිංචි කිරීම සඳහා කරනු ලබන ඉල්ලීමක් රෙජිස්ට්‍රාර්වරයා වෙත නියමිත ආකෘති පත්‍රයක් මගින් ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(2) එවැනි පිඹුරක් ලියාපදිංචි කිරීම සඳහා වන ඉල්ලීමක් සමග –

(අ) (මෙහි මින් මතු ලියාපදිංචි කරන ලද සභාධිපත්‍ය පිඹුරේ හෝ ලියාපදිංචි කරන ලද අර්ධ සභාධිපත්‍ය පිඹුරේ, "සංශෝධිත පිඹුර" යනුවෙන් සඳහන් කරනු ලබන) දැනට පවතින ලියාපදිංචි කරන ලද සභාධිපත්‍ය පිඹුරේ හෝ ලියාපදිංචි කරන ලද අර්ධ සභාධිපත්‍ය පිඹුරේ සභාධිපත්‍ය කොටසට කරනු ලබනු අදාළ වෙනස් කිරීම් පෙන්වමින් බලපත්‍ර ලත් මිනින්දෝරුවරයකු විසින් සකස් කරන ලද සහ අඳින ලද සහ පිටපත් තුනකින් ඉදිරිපත් කරනු ලැබූ මිනින්දෝරු පිඹුරක් ;

(ආ) බිම පවතින තත්ත්වය මිනින්දෝරු පිඹුරේ දක්වා ඇති වෙනස් කිරීම්වලට අනුකූල වන්නා වූ බවට තහවුරු කරමින් සුදුසුකම් ලත් ගෘහ නිර්මාණ ශිල්පියකු හෝ සුදුසුකම් ලත් සිවිල් හෝ ගොඩනැගිලි ඉංජිනේරුවරයකුගෙන් හෝ ලබා ගන්නා ලද සහතිකයක් ;

(ඇ) සභාධිපත්‍ය කොටසට කරන ලද වෙනස් කිරීම්, සභාධිපත්‍ය දේපළ හෝ අර්ධ සභාධිපත්‍ය දේපළේ පොදු කොටස් පාලනය, පරිපාලනය, නඩත්තු කිරීම සහ

කළමනාකරණය හා සම්බන්ධ නියමයන්ට යම් අහිතකර බලපෑමක් ඇති නොකරන්නා වූ බවට සහතික කරමින් සාමාන්‍යාධිකාරිවරයාගෙන් ලබා ගන්නා ලද සහතිකයක් ;

(ඈ) අනුමත කරන ලද ගොඩනැගිල්ලේ පිඹුරට බලපාන්නා වූ එවැනි වෙනස් කිරීම් සඳහා අදාළ බලයලත් බලධරයාගෙන් අනුමැතිය ලබා ගත් සහතිකයක් :

(ඉ) ඒ සහාධිපත්‍ය කොටසට බලපාන්නා වූ එකී වෙනස් කිරීම් සඳහා යම් අදාළ උකස් හිමියකු ඇත්නම් ඒ අදාළ උකස් හිමියාගේ අභිමතය සඳහන් ප්‍රකාශනයක්,

ඉදිරිපත් කළ යුතු ය.

ප්‍රධාන ප්‍රඥප්තියට 8අ සහ 8ආ අලුත් වගන්ති ඇතුළත් කිරීම.

**12.** 8 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්ති මෙයින් ඇතුළත් කරනු ලබන අතර ඒවා ප්‍රධාන ප්‍රඥප්තියේ 8අ සහ 8ආ වගන්ති ලෙස බලාත්මක විය යුතු ය :–

"ලියාපදිංචි කරන ලද අර්ධ සහාධිපත්‍ය පිඹුරේ පෙන්වා ඇති කොටසක් සම්පූර්ණ කර ඇති ගොඩනැගිල්ලට පසුව එකතු කරන ලද සහාධිපත්‍ය කොටස්වල ලියාපදිංචි කිරීම.

8අ. (1) ලියාපදිංචි කරන ලද අර්ධ සහාධිපත්‍ය පිඹුරේ පෙන්වා ඇති කොටසක් සම්පූර්ණ කර ඇති ගොඩනැගිල්ලට පසුව එකතු කරන ලද යම් සහාධිපත්‍ය කොටස්වල ලියාපදිංචි කිරීම සඳහා යම් අර්ධ සහාධිපත්‍ය දේපළක අයිතිකරු විසින් රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉල්ලුම් කරනු ලැබිය හැකි ය.

(2) (1) වන වගන්තිය යටතේ ලියාපදිංචි කිරීම සඳහා ඉදිරිපත් කරනු ලබන ඉල්ලුම් පත්‍රයක් නියමිත ආකෘති පත්‍රයක විය යුතු අතර එයට පහත සඳහන් දේ අඩංගු විය යුතු ය :–

(අ) නියමිත ගාස්තුව ;

(ආ) (මෙහි මින් මතු ලියාපදිංචි කරන ලද අර්ධ සහාධිපත්‍ය පිඹුරේ "එකතු කිරීම් කරන ලද පිඹුර" යනුවෙන් සඳහන් කරනු ලබන) මිනුම්පතිවරයාගේ බලය මගින්

හෝ ඒ යටතේ බලයලත් මිනින්දෝරුවකු විසින් සකස් කරන ලද සහ අදින ලද මිනින්දෝරු පිඹුර භාර දෙනු ලැබිය යුතු අතර ඒ මිනින්දෝරු පිඹුර මගින් –

(i) ලියාපදිංචි කරන ලද අර්ධ සහාධිපත්‍ය පිඹුරේ පෙන්වා ඇති කොටසක් සම්පූර්ණ කර ඇති ගොඩනැගිල්ලට පසුව එකතු කරන ලද අදාළ සහාධිපත්‍ය කොටස් පෙන්වා දෙනු ලැබිය යුතු ය ;

(ii) ඒ සහාධිපත්‍ය කොටස්වල අංගග පොදු අංගෝපාංගවල එක් එක් සහාධිපත්‍ය කොටසේ, තනි පුද්ගල කොටසේ නොබෙදූ කොටස් වටිනාකම සහ ප්‍රතිශතය පෙන්වා තිබිය යුතු ය :

(iii) කැඩැස්තර සිතියමේ යොමු අංකය සහ අර්ධ සහාධිපත්‍ය පිඹුරේ පෙන්වා ඇති එක් එක් සහාධිපත්‍ය කොටස්වල සහාධිපත්‍ය හිමිකම් සහතිකයේ පෙර ලියාපදිංචි අංකය ලබාදිය යුතු ය ;

(ඇ) එකතු කිරීමේ පිඹුරේ පෙන්වා ඇති සහාධිපත්‍ය කොටස් මගින් ඉදිමේ පවතින තත්ත්වය තහවුරු කරන බවට සුදුසුකම් ලත් ගෘහ නිර්මාණ ශිල්පියකුගෙන් හෝ සුදුසුකම් ලත් සිවිල් හෝ ව්‍යූහ ඉංජිනේරුවකුගෙන් ලබාගත් සහතිකයක් ;

(ඈ) එකතු කිරීමේ පිඹුරේ පෙන්වා ඇති සහාධිපත්‍ය කොටස් මිනිස් වාසය සඳහා යෝග්‍ය බව සහ එකී කොටස්වලට සපයා ඇති පොදු පහසුකම් සේවා පිළිබඳව සෑහීමට පත්විය හැකි බවට සහතික කරමින් සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරයේ සාමාන්‍යාධිකාරීවරයාගෙන් ලබා ගන්නා සහතිකය ;

(ඉ) 3අ වගන්තියේ (2) වන උපවගන්තියේ (උ) ඡේදයේ නිශ්චිතව දක්වා ඇති විධිවිධානවලට යටත්ව අර්ධ සහාධිපත්‍ය හිමිකම් සහතිකය ;

(ඊ) ලියාපදිංචි අර්ධ සහාධිපත්‍ය පිඹුරේ එකතු කිරීමේ පිඹුරේ පෙන්වා ඇති සහාධිපත්‍ය කොටස් නියෝග සමග අනුකූල වන බවට ගොඩනැගිලි පිඹුරු අනුමත කිරීමට බලය පවරා ඇති බලධරයාගෙන් ලබා ගන්නා අනුකූලතා සහතිකය ;

(උ) 3ඇ වගන්තියේ (2) වන උපවගන්තියේ (ඌ) ඡේදයේ නිශ්චිතව දක්වා ඇති විධිවිධානවලට අනුව ඉල්ලුම්කරු විසින් කරනු ලබන ප්‍රකාශනය ;

(ඌ) ප්‍රසිද්ධ නොතාරිස් විසින් සහතික කරන ලද සහ ඉල්ලුම්කරු විසින් කරනු ලබන ප්‍රකාශනයේ –

(i) ලියාපදිංචි අයිතිකරුගේ සම්පූර්ණ නම සහ ලිපිනය ද, සහාධිපත්‍ය කොටස් හා සම්බන්ධ සහාධිපත්‍ය හිමිකම් සහතිකවලට අදාළ යොමු අංකය ;

(ii) ලියාපදිංචි කරන ලද සහාධිපත්‍ය පිඹුරේ එකතු කළ පිඹුරේ පෙන්වා ඇති සහාධිපත්‍ය කොටස්වල අංගගත පොදු අංගෝපාංගවල එක් එක් සහාධිපත්‍ය කොටසේ නොබෙදූ කොටස් වටිනාකම සහ ඒ වටිනාකමේ ප්‍රතිශතය ;

(iii) අර්ධ සහාධිපත්‍ය පිඹුරේ පෙර ලියාපදිංචියේ යොමු අංකය ;

(iv) ලියාපදිංචි කරන ලද අර්ධ සහාධිපත්‍ය පිඹුරේ එකතු කළ පිඹුරේ පෙන්වා ඇති ඒ සහාධිපත්‍ය කොටස් වෙන්කිරීම සඳහා සිය නම් දෙනු ලැබූ අපේක්ෂිත ගැනුම්කරුවන්ගෙන් දැනටමත් ලබාගෙන ඇති අත්තිකාරම් මුදල් පිළිබඳව ගිණුම් ප්‍රකාශයක් ;

(v) අර්ධ සහාධිපත්‍ය දේපළේ අයිතිකරුගේ හෝ අයිතිකරුවන්ගේ අත්සන,

අන්තර්ගත විය යුතු ය.

තාවකාලික සහාධිපත්‍ය දේපළේ ලියාපදිංචි කරන ලද තාවකාලික සහාධිපත්‍ය පිඹුරට කරනු ලබන සංශෝධනය.

8ආ. යම් ලියාපදිංචි කරන ලද තාවකාලික සහාධිපත්‍ය දේපළක අයිතිකරු විසින් ලියාපදිංචි කරන ලද තාවකාලික සහාධිපත්‍ය පිඹුරේ "සංශෝධන පිඹුර" ලියාපදිංචි කිරීම සඳහා රෙජිස්ට්‍රාර්වරයා වෙත ලිඛිතව ඉල්ලුම් කරනු ලැබිය හැකි ය.

අයිතිකරු විසින් ඒ ලියාපදිංචිය සඳහා නියමිත ආකෘති පත්‍රයක කරනු ලබන ඉල්ලීම සමඟ පහත සඳහන් දෑ ඉදිරිපත් කළ යුතු ය.

(අ) (මෙහි මින් මතු ලියාපදිංචි කරන ලද තාවකාලික සහාධිපත්‍ය පිඹුරේ "සංශෝධන පිඹුර" යනුවෙන් හඳුන්වනු ලබන) ලියාපදිංචි කරන ලද තාවකාලික සහාධිපත්‍ය පිඹුරේ තාවකාලික සහාධිපත්‍ය කොටසට කරන ලද අදාළ වෙනස්කම් පෙන්වමින් බලයලත් මිනින්දෝරුවකු විසින් සකස් කරන ලද සහ අඳින ලද මිනින්දෝරු පිඹුරක් පිටපත් තුනකින් යුක්තව ඉදිරිපත් කරනු ලැබිය යුතු ය;

(ආ) සුදුසුකම්ලත් ප්‍රමාණ තක්සේරුකරුවකු හෝ සුදුසුකම්ලත් සිවිල් හෝ ව්‍යුහ ඉංජිනේරුවරයකු විසින් සත්‍යයනය කරන ලද ලියාපදිංචි තාවකාලික සහාධිපත්‍ය පිඹුරට බලපාන සංශෝධනවලට අනුව ගොඩනැගිල්ලේ ඉදිකිරීමේ වියදම තහවුරු කරනු ලබන්නා වූ මූල්‍ය වාර්තාවක් ද සමඟ ඉල්ලුම්කරුගේ ප්‍රකාශනයක් ; සහ

(i) යෝජනා ක්‍රමය සඳහා අරමුදල් සැපයීමට ඇති කැමැත්ත පෙන්නුම් කරමින් පිළිගත් මූල්‍ය ආයතනයකින්

ලබාගත් සහතිකයක් මගින් සනාථ කරනු ලබන්නා වූ ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා අරමුදල් ඇති බව ;

(ii) තාවකාලික සහාධිපත්‍ය දේපළ උකස් කිරීමෙන් දැනටමත් ලබාගත් හෝ ලබා ගැනීමට ඇති අරමුදල් පිළිබඳ සහ එක් එක් තාවකාලික සහාධිපත්‍ය කොටස හෝ කොටස්වලට එරෙහිව ලබාගත් හෝ ලබාගැනීමට ඇති මුදල් පිළිබඳ විස්තර සහ පිළිගත් මූල්‍ය ආයතනයෙන් ලබාගත් සහතිකයක් මගින් සනාථ කරන්නා වූ ඒ මූල්‍ය ආයතනයේ නම ;

(ඇ) පහත දැක්වෙන එක් එක් ක්‍රියාකාරකම් ආරම්භ කිරීමේ දිනය සහ සම්පූර්ණ කිරීමේ දිනය පෙන්නුම් කරමින් සම්පූර්ණ ඉදිකිරීම් පිළිබඳ ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම සහ එය සනාථ කරන සුදුසුකම් ලත් වාස්තු විද්‍යාඥයන්ගෙන් හෝ සුදුසුකම් ලත් වෘත්තීමය සිවිල් හෝ ව්‍යුහ ඉංජිනේරුවකුගෙන් ලබාගත් සහතිකයක් :–

(i) අත්තිවාරම සහ යකඩ කණු,

(ii) බිත්ති ඉදිකිරීම,

(iii) තට්ටුව ඉදිකිරීම,

(iv) වහළ ඉදිකිරීම,

(v) මනුෂ්‍ය වාසය සඳහා සුදුසු මට්ටමට අවසාන ඉදිකිරීම් කටයුතු ඉදිකිරීම.

(ඈ) තාවකාලික සහාධිපත්‍ය කොටසට කරන ලද වෙනස් කිරීම් මගින් කළමනාකරණ සංස්ථාවේ පොදු අංගෝපාංග පාලනය කිරීම, පරිපාලනය කිරීම, නඩත්තු කිරීම හා කළමනාකරණය පිළිබඳ අවශ්‍යතා වලට යම් අහිතකර බලපෑමක් ඇති නොවන බවට සහතික කරමින් සාමාන්‍යාධිකාරීවරයා විසින් කරනු ලබන සහතිකය ;

(ඉ) අනුමත කරන ලද ගොඩනැගිලි පිඹුරට බලපාන්නා වූ එවැනි වෙනස්කිරීම් සඳහා අදාළ බලධරයාගේ අනුමතය ලබාගත් ප්‍රකාශනයක්.

**13.** ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :– ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

"සහාධිපත්‍ය පිඹුර හෝ අර්ධ සහාධිපත්‍ය පිඹුර ලියාපදිංචි කිරීමේ බලපෑම.

9. (1) සහාධිපත්‍ය පිඹුර හෝ අර්ධ සහාධිපත්‍ය පිඹුර ලියාපදිංචි කිරීමේ දී සහාධිපත්‍ය දේපළේ හෝ අර්ධ සහාධිපත්‍ය දේපළෙහි පෙන්නුම් කර ඇති එක් එක් ගොඩනැගිල්ල හෝ අර්ධ වශයෙන් සම්පූර්ණ කර ඇති ගොඩනැගිල්ල ඒකකවලට බෙදු ඇති ලෙසත් එහි එලෙස හඳුනාගෙන ඇති බවටත් සලකනු ලැබිය යුතු අතර, ඉන්පසු සහාධිපත්‍ය කොටස්වල අයිතිකරුවන්ගේ අදාළ හිමිකම් කොටස්වලට සමානුපාතිකව ද ඔවුන් විසින් දරනු ලබන අදාළ සහාධිපත්‍ය කොටස්වල නියමයන්ට සහ භුක්තිය අනුව ද එම සහාධිපත්‍ය කොටස්වල අයිතිකරුවන් විසින් කුලී නිවැසියන් වශයෙන් පොදු අංගොපාංග දරනු ලැබිය යුතු ය.

(2) සහාධිපත්‍ය පිඹුර හෝ අර්ධ සහාධිපත්‍ය පිඹුර ලියාපදිංචි කිරීමේ දී රෙජිස්ට්‍රාර්වරයා විසින් සහාධිපත්‍ය කොටසේ පොදු අංගෝපාංගවල අයිතිකරුගේ කොටස සහතික කරනු ලැබිය යුතු ය.

(3) සහාධිපත්‍ය කොටසේ පොදු අංගෝපාංගවල එක් එක් අයිතිකරුගේ කොටස් අගය, අවස්ථාවෝචිත පරිදි වාණිජ හෝ නේවාසික හෝ වෙනත් ආකාරයේ වුව ද, සහාධිපත්‍ය කොටස පාවිච්චි කරන්නාට අනුව දෙනු ලැබිය යුතු ය.

(4) වෙනත් යම් නීතියකට පටහැනිව කුමක් සඳහන් වුව ද, එය නොතකා සහ මේ පනතේ විධිවිධානවලට යටත්ව, සහාධිපත්‍ය පිඹුර හෝ අර්ධ සහාධිපත්‍ය පිඹුර ලියාපදිංචි කිරීමෙන් පසුව එහි අඩංගු පොදු අංගෝපාංග ද සමග එහි පෙන්වා ඇති යම් සහාධිපත්‍ය කොටසක් යම් ඉඩමක ආකාරයට දරනු ලැබීම හෝ ඒ සම්බන්ධයෙන් ක්‍රියා කිරීම කරනු ලැබිය හැකි ය.

(5) සහාධිපත්‍ය පිඹුරක් හෝ අර්ධ සහාධිපත්‍ය පිඹුරක් ලියාපදිංචි කිරීමෙන් පසු, එහි දැක්වෙන එක් එක් සහාධිපත්‍ය කොටස එයට අනුබද්ධ පොදු අංගෝපාංග සමග ඒ සහාධිපත්‍ය දේපළේ හෝ අර්ධ සහාධිපත්‍ය දේපළේ අයිතිකරු හෝ අයිතිකරුවන් වශයෙන් ඒ පිඹුරේ විස්තර කරනු ලැබූ යම් තැනැත්තකු හෝ තැනැත්තන් විසින් සම්පූර්ණයෙන් ම අත්කරගනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය. එහෙත්, ඒ ලියාපදිංචි කිරීමට පෙර යම් තැනැත්තකුට එම සහාධිපත්‍ය දේපළ හෝ අර්ධ සහාධිපත්‍ය දේපළ පිළිබඳව තිබුණු යම් උකසක්, විකිණීම සඳහා වූ ගිවිසුමක් හෝ සම්බන්ධතාවක් කෙරෙහි ඇති වූ අහිතකර බලපෑමක ප්‍රතිඵලයක් වශයෙන් දැරීමට සිදු වූ යම් පාඩුවක් වෙනුවෙන් යම් උකසකට අදාළ නීතිය ප්‍රකාරව පරාමේ බලය ක්‍රියාවේ යෙදවීමට උකස්කරුට ඇති අයිතියට හෝ මුදල් වන්දි ලබා ගැනීමට ඔහුට ඇති අයිතියට නැතහොත් මුදල් වන්දි ලබා ගැනීමට වෙනත් යම් තැනැත්තකුට ඇති අයිතියට ඉන් හානියක් නොවිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියට 9අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

**14.** 9 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය ඇතුළත් කරනු ලබන අතර, ඒ වගන්තිය ප්‍රධාන ප්‍රඥප්තියේ 9අ වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය :-

"තාවකාලික සහාධිපත්‍ය පිඹුර ලියාපදිංචි කිරීමේ ඇති බලපෑම.

9ඇ. තාවකාලික සහාධිපත්‍ය පිඹුරක් ලියාපදිංචි කිරීමෙන් පසු එහි දැක්වෙන එක් එක් තාවකාලික සහාධිපත්‍ය කොටස එයට අනුබද්ධ පොදු අංගෝපාංග සමග ඒ තාවකාලික සහාධිපත්‍ය දේපළේ අයිතිකරු හෝ වශයෙන් ඒ පිඹුරෙහි විස්තර කරනු ලැබූ යම් තැනැත්තකු විසින් සම්පූර්ණයෙන්ම අත්කරගනු ලැබූ ලෙස සැලකිය යුතු අතර, ඔහු විසින් පහත දැක්වෙන සීමාකිරීම්වලට යටත්ව ඒ අයිතිය ක්‍රියාත්මක කළ යුතු ය :-

(අ) තාවකාලික සහාධිපත්‍ය පිඹුර ලියාපදිංචි කිරීමට පෙර හෝ තාවකාලික සහාධිපත්‍ය පිඹුර ලියාපදිංචි කිරීමෙන් පසු හෝ යෝජිත ගොඩනැගිල්ල ඉදිකිරීමට අපේක්ෂිත ඉඩම් කොටස ලබා ගනිමින් යම් උකසක් ඇති අවස්ථාවක, එවැනි එක් එක් තාවකාලික සහාධිපත්‍ය කොටස්වලට ව්‍යාප්ත විය යුතු අතර, උකස්හිමියා හෝ උකස් හිමියන්ගේ කැමැත්ත නොමැතිව වෙනත් යම් පාර්ශ්වයකගේ වාසියට තාවකාලික සහාධිපත්‍ය කොටස හෝ ඉඩම් කොටස සම්බන්ධයෙන් යම් සාධන පත්‍රයක් ලියා අත්සන් කිරීමට කිසිදු අයිතියක් නොතිබිය යුතු ය ;

(ආ) රෙජිස්ට්‍රාර්වරයා වෙත ලියාපදිංචි කර ඇති එක් එක් තාවකාලික සහාධිපත්‍ය කොටස සඳහා වූ යම් විකිණීමේ ගිවිසුමක් තිබීම, එකී විකිණීමේ ගිවිසුමට පාර්ශ්වකරුවකු වන අපේක්ෂිත මිල දී ගන්නාගේ අයිතිවාසිකම්වලට හානියක් නොමැතිව, පරම අයිතිය පිළිබඳ බැඳීමක් ලෙස සලකනු ලැබිය යුතු ය :

(ඇ) තාවකාලික සහාධිපත්‍ය පිඹුරෙහි පෙන්නුම් කර ඇති වූ ද ගොඩනැගිල්ලක් ඉදිකිරීමට යෝජනා කරනු ලැබ ඇති වූ ද ඉඩම් කොටස, එකී ගොඩනැගිල්ල අර්ධ වශයෙන් සම්පූර්ණ කරන තුරු

සහ "අර්ධ සහාධිපත්‍ය දේපළක්" ලෙස රෙජිස්ට්‍රාර්වරයා වෙත ලියාපදිංචි කරන තුරු එම ඉඩම් කොටස එහි අයිතිකරු විසින්, උකසක් මගින් හැර, විකිණීම, බද්දට දීම, කුලියට දීම හෝ අන් ආකාරයකින් බැහැර කිරීම නොකළ යුතු ය. මේ විධිවිධාන උල්ලංඝනය කරමින් අයිතිකරු විසින් උකස් කිරීමක් හැර ඔහු විසින් ලියා අත්සන් කරනු ලබන යම් විකිණීමක්, බදු දීමක්, කුලියට දීමක් හෝ අන් ආකාරයකින් බැහැර කිරීමක් ශූන්‍ය සහ බලරහිත විය යුතු අතර, එයට නීතියෙහි ලා කිසිදු බලයක් හෝ බලපෑමක් නොතිබිය යුතු ය :

එසේ වුව ද වෙනත් යම් ලිඛිත නීතියකට අනුකූලව උකස් බැඳුම්කරයක් මත හෝ විකිණීම සඳහා ගිවිසුමක් මත අයවිය යුතු මුදල් ආපසු අයකර ගැනීම සඳහා යම් අධිකාරියක් විසින් එකී දේපළ විකිණීම වළක්වන ලෙස මේ විධිවිධානවල සඳහන් කිසිවක් සලකනු නොලැබිය යුතු ය.".

**ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.**

**15.** ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :-

"සහාධිපත්‍ය කොටසකට බලපාන සාධන පත්‍රයක් ලියාපදිංචි කිරීම.

10. (1) ලියාපදිංචි සහාධිපත්‍ය දේපළක හෝ ලියාපදිංචි අර්ධ සහාධිපත්‍ය දේපළක යම් සහාධිපත්‍ය කොටසක අයිතිය හෝ සම්බන්ධතාව හෝ ප්‍රතිලාභ හෝ අත්කරගන්නා කිසිම තැනැත්තකුට එම අයිතිය හෝ සම්බන්ධතාව හෝ ප්‍රතිලාභ 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ විධිවිධාන යටතේ ලියාපදිංචි කරනු ලැබ ඇත්නම් මිස, එම අයිතිය හෝ සම්බන්ධතාව හෝ හිමිකම ඔහුට හිමි නොවිය යුතු ය.

(2) සහාධිපත්‍ය කොටසකට අයිතිය හෝ සම්බන්ධතාව හෝ ප්‍රතිලාභ පැවරීම සඳහා යම් සාධන පත්‍රයක් ලියාපදිංචි කිරීමට භාර ගැනීමෙන් පසු, රෙජිස්ට්‍රාර්වරයා විසින් නියමිත ආකාරයට අදාළ සහාධිපත්‍ය කොටස සම්බන්ධයෙන් හිමිකම් ලේඛනයෙහි එම අයිතිය හෝ සම්බන්ධතාව හෝ ප්‍රතිලාභය ලියාපදිංචි කළ යුතු අතර, ලියාපදිංචි සහාධිපත්‍ය පිඹුර හෝ ලියාපදිංචි අර්ධ සහාධිපත්‍ය පිඹුර පිළිබඳව එහි සුදුසු යොමු සටහනක් කළ යුතු ය.

(3) ලියාපදිංචි සහාධිපත්‍ය කොටසකට අදාළව පසුව කරනු ලබන ගනුදෙනුවක් සම්බන්ධයෙන් 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ 40, 41, 42, 43, 44, 45, 46, 47, 48 සහ 49 වන වගන්තිවල විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාළ විය යුතු ය.".

**16.** ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ :-

**ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.**

**"දේපළෙහි පොදු අංගෝපාංගවල කොටස්.**

11. ලියාපදිංචි සහාධිපත්‍ය දේපළක හෝ ලියාපදිංචි අර්ධ සහාධිපත්‍ය දේපළක පොදු අංගෝපාංගවල කිසිදු කොටසක් එම දේපළේ සහාධිපත්‍ය කොටසට අනුබද්ධිත ලෙස හැර බැහැර කිරීම හෝ ඒ සම්බන්ධයෙන් අන්‍යාකාරයකින් ක්‍රියා කිරීම නොකළ යුතු අතර, ඒ සහාධිපත්‍ය කොටස පිළිබඳ යම් අන්සතු කිරීමකට අදාළ සාධන පත්‍රයේ හෝ ඔප්පුවේ කිසිදු විශේෂිත සඳහනක් නැති වුව ද, එම අන්සතු කිරීම මගින් එම සහාධිපත්‍ය කොටසට අනුබද්ධිත පොදු අංගෝපාංගවල අයිතිකරුගේ නොබෙදූ කොටස් පවරනු ලබන ලෙස සලකනු ලැබිය යුතු ය.".

**17.** ප්‍රධාන ප්‍රඥප්තියේ 11අ වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :-

**ප්‍රධාන ප්‍රඥප්තියේ 11අ වගන්තිය ප්‍රතියෝජනය කිරීම.**

"අතිරේක කොටස්.

11ඈ. (1) අදාළ ලියාපදිංචි සහාධිපත්‍ය පිඹුරේ හෝ අදාළ ලියාපදිංචි අර්ධ සහාධිපත්‍ය පිඹුරේ පෙන්නුම් කර ඇති වූ ද සහාධිපත්‍ය කොටසට අනුබද්ධිත වූ ද කිසිදු අතිරේක කොටසක් හෝ එහි අන්තර්ගත යම් කොටසක් හෝ බූදලයක් හෝ සම්බන්ධතාවක් සහාධිපත්‍ය කොටසට පරිබාහිරව ඒ අතිරේක කොටස සම්බන්ධයෙන් ක්‍රියා කරනු නොලැබිය යුතු ය.

(2) ලියාපදිංචි අදාළ සහාධිපත්‍ය පිඹුරෙහි හෝ ලියාපදිංචි අදාළ අර්ධ සහාධිපත්‍ය පිඹුරේ අනුබද්ධිත ලෙස පෙන්නුම් කර ඇති වූ යම් අතිරේක කොටසක් එම සහාධිපත්‍ය කොටසට අනුබද්ධ නොකර එම අතිරේක කොටස හෝ යම් කොටසක්, දේපළක් හෝ සම්බන්ධතාවක් සම්බන්ධයෙන් ස්වාධීනව ක්‍රියා කරන යම් තැනැත්තකු මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතු ය.

(3) (1) වන උපවගන්තියේ විධිවිධාන කඩකරමින් සිදු කරන ලද යම් රක්ෂණයක් මේ නීතිය යටතේ ලියාපදිංචි නොකළ යුතු අතර, එවැනි යම් ලියාපදිංචි කිරීමක් ශූන්‍ය සහ බලරහිත විය යුතු අතර, අතිරේක කොටසේ යම් බූදලයකට හෝ සම්බන්ධතාවකට එය බල නොපෑ යුතු ය.

(4) යම් රක්ෂණය කිරීමක් ලියාපදිංචි කරනු ලැබ ඇති අවස්ථාවක රෙජිස්ට්‍රාර්වරයා විසින් එය සොයා ගැනීමේ දී ඔහු විසින් එය අවලංගු කරනු ලැබිය යුතු අතර, එවැනි අවලංගු කිරීමක් බලපාන කිසිදු තැනැත්තකුට යම් වන්දියක් ලබාගැනීම සඳහා අයිතියක් නොතිබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

**18.** ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ආදේශ කරනු ලැබේ :-

"සහාධිපත්‍ය කොටස් නැවත බෙදා වෙන් කිරීම හෝ ඒකාබද්ධ කිරීම.

12. (1) සහාධිපත්‍ය දේපළක හෝ අර්ධ සහාධිපත්‍ය දේපළක සහාධිපත්‍ය කොටසේ යම් අයිතිකරුවකු හෝ අයිතිකරුවන් විසින්, සහාධිපත්‍ය දේපළේ හෝ අර්ධ සහාධිපත්‍ය දේපළේ ලියාපදිංචි සහාධිපත්‍ය පිඹුරෙහි හෝ ලියාපදිංචි අර්ධ සහාධිපත්‍ය පිඹුරෙහි "නැවත බෙදා වෙන් කිරීමේ පිඹුර" හෝ "ඒකාබද්ධ කිරීමේ පිඹුර" ලියාපදිංචි කිරීම සඳහා ලිඛිතව රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉල්ලුම් කළ හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ වූ ඉල්ලීමක් නියමිත ආකෘති පත්‍රයේ ඉදිරිපත් කළ යුතු අතර ඒ සමග–

(අ) නියමිත ගාස්තුව ;

(ආ) බලයලත් මිනින්දෝරුවරයකු විසින් හෝ සර්වේයර් ජනරාල්වරයාගේ අධිකාරිය යටතේ සකස් කොට අඳින ලද (මෙහි මින් මතු ලියාපදිංචි සහාධිපත්‍ය පිඹුරේ හෝ ලියාපදිංචි අර්ධ සහාධිපත්‍ය පිඹුරේ "නැවත බෙදා වෙන් කිරීමේ පිඹුර" හෝ "ඒකාබද්ධ කිරීමේ පිඹුර" යනුවෙන් සඳහන් කරනු ලබන්නා වූ ද )

(i) නැවත බෙදා වෙන්කිරීම හෝ ඒකාබද්ධ කිරීමට ඇති ලියාපදිංචි සහාධිපත්‍ය පිඹුරේ හෝ ලියාපදිංචි අර්ධ සහාධිපත්‍ය පිඹුරේ දැනට පවත්නා සහාධිපත්‍ය කොටසට හෝ කොටස්වලට සිදු කරනු ලබන අදාළ වෙනස්කම් පෙන්වන ;

(ii) නැවත බෙදා වෙන් කරන ලද සේ ඒකාබද්ධ කරන ලද සහාධිපත්‍ය කොටසට අනුබද්ධිත පොදු අංගෝපාංගවල එක් එක් සහාධිපත්‍ය කොටසේ නොබෙදූ හිමිකම් වටිනාකම සහ තනි පුද්ගල හිමිකමේ සියයට ප්‍රමාණය පෙන්නුම් කරන ;

(iii) එක් එක් සහාධිපත්‍ය කොටසේ සහාධිපත්‍ය හිමිකම පිළිබඳ සහතිකයේ කලින් ලියාපදිංචි අංකය සහ කැඩැස්තර සිතියමේ යොමු අංකය ලබාදෙන,

පිටපත් තුනකින් යුත් මානක සැලැස්මක් ;

(ඇ) නැවත බෙදා වෙන්කිරීමේ පිඹුරේ හෝ ඒකාබද්ධ කිරීමේ පිඹුරේ පෙන්නුම් කර ඇති නැවත බෙදා වෙන්කිරීම හෝ ඒකාබද්ධ කිරීම ඉඩමේ ඇති පිහිටීමට අනුකූල වන බවට සුදුසුකම් ලත් වාස්තු විද්‍යාඥයකුගෙන් සහ සුදුසුකම් ලත් සිවිල් හෝ ව්‍යුහ ඉංජිනේරුවරයකුගෙන් ලබාගත් සහතිකයක් ;

(ඈ) සහාධිපත්‍ය දේපලේ හෝ අර්ධ සහාධිපත්‍ය දේපලේ පොදු අංගෝපාංගවල පාලනය, පරිපාලනය, නඩත්තුව සහ කළමනාකරණය පිළිබඳ අවශ්‍යතාවලට නැවත බෙදා වෙන් කිරීම හෝ ඒකාබද්ධ කිරීම මගින් හානියක් සිදු නොවන බවට සහතික කරමින් සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරියේ සාමාන්‍යාධිකාරිවරයාගෙන් ලබාගත් සහතිකයක් ;

(ඉ) අනුමත ගොඩනැගිලි සැලැස්මට සිදු කිරීමට යන නැවත බෙදා වෙන්කිරීම හෝ ඒකාබද්ධ කිරීම සඳහා අදාළ අධිකාරියේ අනුමැතිය ;

(ඊ) සහාධිපත්‍ය කොටසට සිදු කිරීමට යන නැවත බෙදා වෙන්කිරීම හෝ ඒකාබද්ධ කිරීම පිළිබඳව, අදාළ උකස් හිමියකු සිටීනම් ඔහුගේ කැමැත්ත ;

( උ) ප්‍රසිද්ධ නොතාරිසවරයකු විසින් සහතික කරන ලද ඉල්ලුම්කරුගේ ප්‍රකාශයක් ; ඒ ප්‍රකාශයේ පහත සඳහන් කරුණු අන්තර්ගත විය යුතු ය :-

(i) නැවත බෙදා වෙන් කිරීමට හෝ ඒකාබද්ධ කිරීමට යෝජිත අදාළ සහාධිපත්‍ය කොටසේ හෝ කොටස්වල ලියාපදිංචි අයිතිකරුගේ හෝ අයිතිකරුවන්ගේ සම්පූර්ණ නම සහ ඔවුන්ගේ ලිපිනයන් සහ සහාධිපත්‍ය හිමිකම් පිළිබඳ සහතිකයට අදාළ යොමු අංක ;

(ii) නැවත බෙදා වෙන් කළ හෝ ඒකාබද්ධ කළ එක් එක් කොටසේ අයිතිකරුවන්ගේ සම්පූර්ණ නම් සහ ලිපිනයන් ලබාදෙමින් අයිතිය පිළිබඳව සිදු කරනු ලබන වෙනස්කම් සඳහා විශ්වාසය තබන සාධන පත්‍ර හෝ ලේඛනවල ස්වභාවය ;

(iii) එම නැවත බෙදා වෙන් කිරීම සහ ඒකාබද්ධ කිරීමට පෙර සහ පසුව එක් එක් සහාධිපත්‍ය කොටසේ සහ ඊට අනුබද්ධිත පොදු අංගෝපාංගවල නොබෙදූ හිමිකම් වටිනාකම සහ ඒ වටිනාකම්වල සියයට ගණන

(iv) සහාධිපත්‍ය දේපළේ හෝ අර්ධ සහාධිපත්‍ය දේපළේ සහාධිපත්‍ය කොටසේ හෝ කොටස්වල අයිතිකරු හෝ අයිතිකරුවන්ගේ අත්සන්,

ඉදිරිපත් කළ යුතු ය.

**19.** ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තියේ "ඒකකය" යන වචනය යෙදී ඇති සෑම තැනකම ඒ වෙනුවට "කොටස" යන වචනය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තිය සංශෝධනය කිරීම.

ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තිය සංශෝධනය කිරීම.

**20.** ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වනන වගන්තියේ "ඒකකය" යන වචනය යෙදෙන සෑම තැනකම ඒ වෙනුවට "කොටස්" යන වචනය යෙදීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 16 වන වගන්තිය සංශෝධනය කිරීම.

**21.** ප්‍රධාන ප්‍රඥප්තියේ 16 වන වගන්තියේ "ඒකකය" යන වචනය යෙදෙන සෑම තැනකම ඒ වෙනුවට "කොටස්" යන වචනය යෙදීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 17 වන වගන්තිය සංශෝධනය කිරීම.

**22.** ප්‍රධාන ප්‍රඥප්තියේ 17 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

(1) ඒ වගන්තියේ "ඒකකය" සහ "ඒකක" යන වචන යෙදී ඇති සෑම තැනකම ඒ වචන වෙනුවට පිළිවෙලින් "කොටස" සහ "කොටස්"යන වචන ආදේශ කිරීමෙන් ;

(2) ඒ වගන්තියේ (4) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :-

"(5) 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ 40, 41, 42, 43, 44, 45, 46, 47, 48 සහ 49 වන වගන්තිවල නිශ්චිතව දක්වා ඇති විධිවිධාන යම් සාධන පත්‍ර ක්‍රියාවේ යෙදවීම සහ එම සාධන පත්‍ර ලියාපදිංචි කිරීම සම්බන්ධයෙන් අවශ්‍ය වෙනස්කම් සහිතව යොදාගනු ලැබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 18 වන වගන්තිය සංශෝධනය කිරීම.

**23.** ප්‍රධාන ප්‍රඥප්තියේ 18 වන වගන්තියේ "ඒකකය" සහ "ඒකක" යන වචන යෙදී ඇති සෑම තැනකම ඒ වෙනුවට පිළිවෙලින් "කොටස" සහ "කොටස්" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 19 වන වගන්තිය සංශෝධනය කිරීම.

**24.** ප්‍රධාන ප්‍රඥප්තියේ 19 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

(1) ඒ වගන්තියේ "ඒකකය" සහ "ඒකක" යන වචන යෙදී ඇති සෑම තැනකම ඒ වෙනුවට පිළිවෙලින් "කොටස" සහ "කොටස්" යන වචන ආදේශ කිරීමෙන් ;

(2) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ "කොටසක අයිතිකරුවකු විසින්" යන වචන වෙනුවට "සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය හෝ සහාධිපත්‍ය කොටසක අයිතිකරුවකු විසින්" යන වචන ආදේශ කිරීමෙන්.

**25.** ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තියේ "ඒකක" යන වචනය යෙදෙන සෑම තැනකම ඒ වෙනුවට "කොටස්" යන වචනය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තිය සංශෝධනය කිරීම.

**26.** ප්‍රධාන ප්‍රඥප්තියේ 20අ වගන්තියේ "ඒකකය" සහ "ඒකක" යන වචන යෙදී ඇති සෑම තැනකම ඒ වෙනුවට පිළිවෙළින් "කොටස" සහ "කොටස්" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 20අ වගන්තිය සංශෝධනය කිරීම.

**27.** ප්‍රධාන ප්‍රඥප්තියේ 20ආ වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

ප්‍රධාන ප්‍රඥප්තියේ 20ආ වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ "ඒකක" යන වචනය වෙනුවට "සහාධිපත්‍ය කොටස්" යන වචන සහ "සහාධිපත්‍ය පිඹුර" යන වචන වෙනුවට "සහාධිපත්‍ය පිඹුර හෝ අර්ධ සහාධිපත්‍ය පිඹුර" යන වචන ආදේශ කිරීමෙන් ;

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ "සහාධිපත්‍ය දේපළ" යන වචන වෙනුවට "සහාධිපත්‍ය දේපළ හෝ අර්ධ සහාධිපත්‍ය දේපළ" යන වචන සහ "ඒකක" යන වචනය වෙනුවට "සහාධිපත්‍ය කොටස්" යන වචන ආදේශ කිරීමෙන් ;

(3) ඒ වගන්තියේ (3) වන උපවගන්තිය ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කිරීමෙන් :-

"(3) මේ පනත ක්‍රියාත්මක වීම ප්‍රකාරව කළමනාකරණ සංස්ථාව පිහිටුවීමෙන් පසු වහාම, මේ පනතේ පළමුවන උපලේඛනයේ විධිවිධානවලට යටත්ව, සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය විසින් එසේ පිහිටුවීමේ දින සිට මාස තුනකට (3) නොවැඩි කාලයක්

ඇතුළත් කළමනාකරණ සංස්ථාවේ පළමුවන වාර්ෂික මහා සභා රැස්වීම කැඳවනු ලැබිය යුතු අතර, පළමුවන සභාව තෝරා පත්කර ගත යුතු ය ; තව ද ඊළඟ වාර්ෂික මහා සභා රැස්වීමේ දී එම අධිකාරිය ධුර දැරීම අවසන් විය යුතු ය. පළමුවන උපලේඛනයේ විධිවිධානවලට යටත්ව පළමුවන සභාව තෝරා පත්කර ගැනීමෙන් පසු එම සභාව විසින් කළමනාකරණ සංස්ථාවේ බලතල ක්‍රියාත්මක කළයුතු අතර කළමනාකරණ සංස්ථාව වෙනුවෙන් එහි කටයුතු පවත්වාගෙන යා යුතු ය.''.

(4) ඒ වගන්තියේ (5) වන සහ (6) වන වගන්තිවල ''ඒකකය'' යන වචනය වෙනුවට ''සහාධිපත්‍ය කොටස'' යන වචන ආදේශ කිරීමෙන් ;

(5) ඒ වගන්තියේ (7) වන උපවගන්තියේ ''සෑම ඒකකයක ම අයිතිකරුවන් යන්නෙන් සහාධිපත්‍ය දේපළට හිමිකම් ඇති තැනැත්තන් ඇතුළත් වේ'' යන වචන වෙනුවට ''සෑම සහාධිපත්‍ය කොටස්වල අයිතිකරුවන් යන්නෙන්, සහාධිපත්‍ය දේපළට හෝ අර්ධ සහාධිපත්‍ය දේපළට හිමිකම් ඇති තැනැත්තන් ඇතුළත් වේ'' යන වචන ආදේශ කිරීමෙන් ;

(6) ඒ වගන්තියේ (7) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන උපවගන්තිය ඇතුළත් කිරීමෙන් :-

''(8) සහාධිපත්‍ය දේපළක්, සහාධිපත්‍ය දේපළක් බවට පරිවර්තනය කර රෙජිස්ට්‍රාර්වරයා විසින් එය සහාධිපත්‍ය දේපළක් ලෙස ලියාපදිංචි කිරීමෙන් පසුව, ලියාපදිංචි කළ අර්ධ සහාධිපත්‍ය දේපළේ කළමනාකරණ සංස්ථාව ලියාපදිංචි කරන ලද සහාධිපත්‍ය දේපළේ ද කළමනාකරණ සංස්ථාව ලෙස දිගටම කටයුතු කළ යුතු ය.''.

ප්‍රධාන ප්‍රඥප්තියේ 20ඇ වගන්තිය සංශෝධනය කිරීම.

**28.** ප්‍රධාන ප්‍රඥප්තියේ 20ඇ වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

(1) ඒ වගන්තියේ ''ඒකකය'' සහ ''ඒකක'' යන වචන යෙදී ඇති සෑම තැනකම ඒ වෙනුවට පිළිවෙලින් ''සහාධිපත්‍ය කොටස'' සහ ''සහාධිපත්‍ය කොටස්'' යන වචන ආදේශ කිරීමෙන් ;

(2) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ –

(අ) ඒ උපවගන්තියේ (උ) ඡේදයේ "සහාධිපත්‍ය දේපළ" යන වචන වෙනුවට "සහාධිපත්‍ය දේපළ හෝ අර්ධ සහාධිපත්‍ය දේපළ" යන වචන ආදේශ කිරීමෙන් ;

(ආ) ඒ උපවගන්තියේ (උ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :–

"(උඋ) අනුමත ගොඩනැගිලි සැලැස්ම උල්ලංඝනය කරමින් සහාධිපත්‍ය දේපළ හෝ අර්ධ සහාධිපත්‍ය දේපළට බලපාන්නා වූ යම් අනවසර ඉදිකිරීමක් ඉවත් කරන ලෙස නියම කරමින් රජය විසින් හෝ රජයේ බලධරයෙක් විසින් කරනු ලබන දැන්වීමකට හෝ නියමයකට අනුකූලව කටයුතු කිරීම සහ එවැනි ඉවත් කිරීමක් සඳහා සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරියට හෝ නාගරික සංවර්ධන අධිකාරියට හෝ පළාත් පාලන ආයතනයට සහාය වන ලෙසට ඉල්ලා සිටීම ;";

(3) ඒ වගන්තියේ (2) වන උපවගන්තියෙහි,

(අ) ඒ උපවගන්තියේ (අ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන ඡේද ඇතුළත් කිරීමෙන් :–

"(අඅ) ගොඩනැගිල්ලේ සහාධිපත්‍ය කොටස් සියල්ල සඳහා ජලය, විදුලිබලය සහ වෙනත් උපයෝගිතාවයන් සැපයීම සඳහා ජාතික ජල සම්පාදන සහ ජලාපවහන මණ්ඩලය, ලංකා විදුලිබල මණ්ඩලය, පළාත් පාලන ආයතන, වෙනත් යම් බල මණ්ඩල හෝ වෙනත් යම් බලපත්‍රලාභීන් සමඟ ගිවිස ගැනීම සහ එම පරිභෝජනය සඳහා සේවා ගාස්තු සහ මාසික ගාස්තු අයකරගැනීම මත සහාධිපත්‍ය කොටස්වල අයිතිකරුවන් සියල්ලටම එම සේවාවන් සැපයීම ;

(අඟා) ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින්, හෝ ලංකා විදුලිබල මණ්ඩලය විසින් හෝ පළාත් පාලන ආයතන විසින් හෝ වෙනත් බල මණ්ඩලයක් හෝ බලාපත්‍රලාභියකු විසින් සපයන ලද ජලය, විදුලිබලය සහ වෙනත් උපයෝගිතාවයන් පරිභෝජනයේ දී වූ මාසික ගාස්තු අයකර ගැනීමට ජලය හෝ විදුලිබලය හෝ වෙනත් උපයෝගිතාවයන් සඳහා වන පුද්ගලික සම්බන්ධතාවයන් විසන්ධි කිරීම මාර්ගයෙන් සහ සහාධිපත්‍ය කොටසේ හෝ කොටස්වලට අයිතිකරුවන් හෝ අයිතිකරුවන් විසින් කළමනාකරණ සංස්ථාවට අදාළ ගාස්තු ගෙවන තෙක් එම සහාධිපත්‍ය කොටස්වලට ලබාදෙන ඒ සැපයුම් දිගටම විසන්ධි කර තැබීමට සියලු පියවර ගැනීම;":

(ආ) ඒ උපවගන්තියේ (ආ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන ඡේදය ඇතුළත් කිරීමෙන් :–

"(ආඅා) 20ඌ වගන්තියේ සඳහන් කරන ලද කාර්යය සඳහා, අදළ සහාධිපත්‍ය කොටස්වල අයිතිකරුවන්ගේ කොටස්වල පංගුවට ප්‍රමානුකූලව සහාධිපත්‍ය කොටස් සියල්ලේම අයිතිකරුවන්ගෙන් මාසික දායක මුදලක් අයකිරීම සහ සහාධිපත්‍ය කොටස් සියල්ලේම අයිතිකරුවන්ගෙන් එම දායක මුදල් අයකර ගැනීම :";

(ඇ) ඒ වගන්තියේ (ඉ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන ඡේදය එකතු කිරීමෙන් :–

"(ඊ) සහතික කරන ලද ගොඩනැගිලි පිඹුරට පටහැනිව සහාධිපත්‍ය දේපළකට හෝ අර්ධ සහාධිපත්‍ය දේපළකට බලපාන අනවසර ඉදිකිරීම් සියල්ල වැළැක්වීමට සහ ඉවත්කිරීමට සියලු පියවර ගැනීම සහ සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරියට හෝ නාගරික සංවර්ධන අධිකාරියට හෝ පළාත් පාලන අධිකාරියට එකී අනවසර ඉදිකිරීම් ඉවත් කරන ලෙසට ඉල්ලා සිටීම හෝ සහාය දීම.".

**29.** ප්‍රධාන ප්‍රඥප්තියේ 20ඈ වගන්තියේ "ඒකකයක්" සහ "ඒකක" යන වචන යෙදී ඇති සෑම තැනකම ඒ වෙනුවට පිළිවෙලින් "සහාධිපත්‍ය කොටස" සහ "සහාධිපත්‍ය කොටස්" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 20 ඈ වගන්තිය සංශෝධනය කිරීම.

**30.** ප්‍රධාන ප්‍රඥප්තියේ 20ඉ වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :- ප්‍රධාන ප්‍රඥප්තියේ 20ඉ වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ "කළමනාකරණ සංස්ථාවේ ඉල්ලීමකින් පසු" යන වචන වෙනුවට "සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරියේ හෝ කළමනාකරණ සංස්ථාවේ ඉල්ලීමකින් පසු" යන වචන ආදේශ කිරීමෙන් ;"

(2) මේ වගන්තියේ "ඒකක" යන වචනය යෙදෙන කවර තැනක වුව ද ඒ වචනය වෙනුවට "සහාධිපත්‍ය දේපළ" යන වචන ආදේශ කිරීමෙන්.

**31.** ප්‍රධාන ප්‍රඥප්තියේ 20ඊ වගන්තියේ "ඒකක" යන වචනය වෙනුවට "සහාධිපත්‍ය කොටස්" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 20ඊ වගන්තිය සංශෝධනය කිරීම.

**32.** ප්‍රධාන ප්‍රඥප්තියේ 20උ වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :- ප්‍රධාන ප්‍රඥප්තියේ 20උ වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ "සහාධිපත්‍ය පිඹුර" යන වචන වෙනුවට "සහාධිපත්‍ය පිඹුර හෝ අර්ධ සහාධිපත්‍ය පිඹුරක" යන වචන ආදේශ කිරීමෙන් ;

(2) ඒ වගන්තියේ (3) වන උපවගන්තිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :-

"(3) සහාධිපත්‍ය පිඹුරක් හෝ අර්ධ සහාධිපත්‍ය පිඹුරක් ලියාපදිංචි කිරීමෙන් පසු, සියලු ගොඩනැගිලි අතුරු බෙදීම්වලට අදාළ කාර්යයන් සඳහා මේ පනතේ දෙවන උපලේඛනයේ දක්වා ඇති අතුරු ව්‍යවස්ථාව බලාත්මක කරනු ලැබිය යුතු ය.";

(3) ඒ වගන්තියේ (4) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කරනු ලැබේ :-

"(4) ආරක්ෂක හා සුරක්ෂිත පියවරවල් සඳහා, සුරතල් සතුන් ඇති කිරීම, වාහන නවතා තැබීම සඳහා, භාවිතය තහනම් කර ඇත්තා වූ කිසියම් පොදු දේපළක් පිළිබඳ වූ කාරණා සඳහා, බිම් ආවරණයේ දී, අපද්‍රව්‍ය බැහැර කිරීම්වල දී, ගෘහනිර්මාණ ශිල්පයේ දී සහ භූමිදර්ශනයේ දී සභාධිපත්‍ය කොටස්වල අයිතිකරුවන් විසින් පිළිපැදිය යුතු නියමු උපදේශ සහ සභාධිපත්‍ය කොටස්වල සහ ලියාපදිංචි කරන ලද සභාධිපත්‍ය පිඹුරට හෝ ලියාපදිංචි කරන ලද අර්ධ සභාධිපත්‍ය පිඹුරට අදාළ සභාධිපත්‍ය දේපළවල හෝ අර්ධ සභාධිපත්‍ය දේපළවල පොදු උපාංගයන්ගේ කාර්යක්ෂම කළමනාකරණයට යෝග්‍ය වෙනත් යම් කාරණා සඳහා, මේ පනතේ දෙවන උපලේඛනයේ දක්වා ඇති අතුරු ව්‍යවස්ථාව අනුකූල නොවන විට, මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව, කළමනාකරණ සංස්ථාව විසින් විශේෂ යෝජනා සම්මතයකින් අතිරේක අතුරු ව්‍යවස්ථාවක්, සාදනු ලැබිය හැකි ය.";

(4) ඒ වගන්තියේ (1) වන සහ (5) වන උපවගන්තිවල "ඒකක" යන වචනය වෙනුවට "සභාධිපත්‍ය කොටස්" යන වචන ආදේශ කිරීමෙන් ;

(5) ඒ වගන්තියේ (6) වන උපවගන්තිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්ති ආදේශ කිරීමෙන් :-

"(6) කළමනාකරණ සංස්ථාව සහ සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය විසින් –

(අ) කලින් කලට බලපවත්වන්නා වූ අතුරු ව්‍යවස්ථාව පිළිබඳ වාර්තාවක් පවත්වාගෙන යා යුතු ය ;

(ආ) බලපවත්නා වූ අතුරු ව්‍යවස්ථාවක පිටපතක් සඳහා, සභාධිපත්‍ය කොටසක අයිතිකරු විසින් හෝ සභාධිපත්‍ය

කොටසක අයිතිකරුවකු වෙනුවට ඉල්ලුම් කිරීමට නිසි බලයලත් තැනැත්තකු විසින් කරන ලද ලිඛිත ඉල්ලීමක් ලැබුන පසුව, එකී අයිතිකරුට හෝ නිසි බලයලත් තැනැත්තාට, සාධාරණ මිලකට අතුරු ව්‍යවස්ථාවේ පිටපතක් ලබා දිය යුතු ය ; සහ

(ඈ) එම අධිකාරියෙන් හෝ එම සංස්ථාවෙන් එසේ ඉල්ලා සිටීමට තමාට නිසි අයිතියක් ඇතැයි සෑහීමට පත්වන්නා වූ යම් තැනැත්තකුගේ ඉල්ලීම මත අතුරු ව්‍යවස්ථාව විමසා බැලීමට සැලැස්විය යුතු ය.";.

(6) ඒ වගන්තියේ (7) වන සහ (10) වන උපවගන්තිවල "ඒකකය" යන වචනය වෙනුවට "සහාධිපත්‍ය කොටස" යන වචන ආදේශ කිරීමෙන් ;

(7) ඒ වගන්තියේ (9) වන උපවගන්තිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :–

"(9) සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරියට හෝ කළමනාකරණ සංස්ථාවට හෝ පරිපාලක හෝ අතුරු නියෝගවලට අනුකූලවීමට බැඳී සිටින යම් තැනැත්තකු විසින්,

(අ) යම් අතුරු නියෝගයක් ක්‍රියාත්මක වීම බලාත්මක කිරීම හෝ කඩවීම වැළැක්වීම සඳහා ; හෝ

(ආ) යම් අතුරු නියෝගයක් කඩකිරීමෙන් පැන නගින, කිසියම් තැනැත්තකුට හෝ දේපළකට සිදුවන පාඩු හෝ හානි සඳහා අලාභ අය කර ගැනීම සඳහා,

වන නියෝගයක් කරන ලෙසට අධිකාරණයෙන් ඉල්ලා සිටීමට සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරියට හෝ කළමනාකරණ සංස්ථාවට හෝ සහාධිපත්‍ය කොටසක කිසියම් අයිතිකරුවකුට හිමිකමක් තිබිය යුතු අතර කළමනාකරණ සංස්ථාව හෝ එහි සාමාජික මණ්ඩල හෝ පරිපාලක යන එවැනි යම් තැනැත්තකුට එරෙහිව අධිකරණය විසින් අධිකරණයට සුදුසු යයි හැඟී යන පරිදි එවැනි නියෝගයක් කරනු ලැබිය හැකි ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 20වැනි වගන්තිය සංශෝධනය කිරීම.

**33.** ප්‍රධාන ප්‍රඥප්තියේ 20වැනි වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :–

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ අවසානයට යෙදෙන (මෙහි මින් මතු "කළමනාකරණ අරමුදල" යනුවෙන් සඳහන් කරනු ලබන) වචන වෙනුවට පහත දැක්වෙන ඡේද ආදේශ කිරීමෙන් :–

(අ) අරමුදලට ගෙවීම සඳහා සංස්ථාව විසින් අයකරගත් සහ අයිතිකරුවන් විසින් ගෙවන ලද දායක මුදල්;

(ආ) අරමුදලට ගෙවීම සඳහා සංස්ථාව විසින් අයකරගත් සහ අයිතිකරුවන් විසින් ගෙවන ලද දඩ, පොලී, දණ්ඩන ගාස්තු, වාරික ප්‍රතිසන්ධි ගාස්තු සහ තැන්පතු ;

(ඇ) සංස්ථාවේ කිසියම් පුද්ගලික දේපළක් බැහැර කිරීමෙන් ලත් මුදල් ;

(ඈ) සංස්ථාවේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන් ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම සහ ක්‍රියාවට නැංවීම මගින් සංස්ථාව විසින් ලබා ගත හැකි යම් මුදල් ප්‍රමාණයන් සියල්ල ;

(ඉ) ශ්‍රී ලංකාව තුළ දී හෝ ඉන් පිටත දී, කවරාකාරයේ හෝ වන යම්කිසි මූලාශ්‍රයන්ගෙන් ණය, පරිත්‍යාග, තෑගි හෝ ප්‍රදානයන් ආකාරයෙන් සංස්ථාව විසින් ලබාගත හැකි යම් මුදල් ප්‍රමාණයන් සියල්ල ;

බැර කළ යුතු ය.

(2) ඒ වගන්තියේ (1) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන උපවගන්තිය ඇතුළත් කිරීමෙන් :–

"(1අ). මේ පනතේ නිශ්චිතව සඳහන් කර ඇති සීමාවන්ට යටත්ව, සංස්ථාව විසින් එහි බලතල, කර්තව්‍ය සහ කාර්යයන්, ක්‍රියාත්මක කිරීම, ඉටුකිරීම සහ ක්‍රියාවට නැංවීම සඳහා දරන ලද වියදම් කිසිවක් පියවීමට අවශ්‍ය යම් මුදල් ප්‍රමාණයන් සියල්ල සංස්ථාවේ කළමනාකරණ අරමුදලෙන් ගෙවනු ලැබිය යුතු ය.";

(3) ඒ වගන්තියේ (2) වන උපවගන්තිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :–

"(2) ඒකමතික යෝජනා සම්මතයක් මගින් හෝ පොදු යෝජනා සම්මතයක් මගින් සහ සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරියේ එකඟත්වය ඇතිව කළමනාකරණ සංස්ථාව විසින්, කළමනාකරණ අරමුදලේ වූ මුදල් කිසිවක් එයට සුදුසු යයි හැගෙන පරිදි ආයෝජනය කරනු ලැබිය හැකි ය :

එසේ වුවද, එම යෝජනා සම්මතය සහ එකඟත්වය, බලපත්‍රලාභි වාණිජ බැංකුවක, භාණ්ඩාගාර බිල්පත්වල, රාජ්‍ය උකස් සහ ආයෝජන බැංකුවක හෝ නිවාස සංවර්ධන සහ මූල්‍ය සංස්ථාවක (බැංකුවක) තිබෙන ස්ථාවර තැන්පතු ගිණුම් කිසිවකින් ආයෝජනය සඳහා අවශ්‍ය නොවිය යුතු ය.";

(4) ඒ වගන්තියේ (3) වන උපවගන්තිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :–

"(3) (1) වන උපවගන්තියේ සඳහන් කරන ලද අරමුණු සඳහා කළමනාකරණ අරමුදලක් පිහිටුවීමේ සහ පවත්වාගෙන යාමේ කාර්යය සඳහා, කළමනාකරණ සංස්ථාව විසින්, මහා සභාවාරයක දී,

(අ) දයක මුදල් ලෙස කලින් කලට වැඩි කළයුතු මුදල් ප්‍රමාණය තීරණය කිරීම ;

(ආ) අදාළ සහාධිපත්‍ය කොටස්වලින් තමන්ගේ කොටස් පංගුවට ප්‍රමාණානුකූලව සහාධිපත්‍ය කොටස් සියල්ලේ අයිතිකරුවන්ගෙන් දයක මුදල් අයකරගැනීමෙන් එසේ තීරණය කරන ලද මුදල් ප්‍රමාණය වැඩි කිරීම ;

(ඇ) ප්‍රමාද වූ දයක මුදල් සම්බන්ධයෙන් සහාධිපත්‍ය කොටසක අයිතිකරුවකු විසින් ගෙවිය හැකි පොලී ප්‍රමාණය තීරණය කිරීම ;

(ඈ) අදාළ සහාධිපත්‍ය කොටස්වලට සපයන ලද, ජලය, විදුලිබලය හෝ වෙනත් උපයෝගිතාවයන් පිළිබඳ වූ සේවාවන් විසන්ධි කළ අවස්ථාවක දී, තැන්පතු හෝ දණ්ඩන ගාස්තු හෝ ප්‍රතිසන්ධි ගාස්තු සහ එම සහාධිපත්‍ය කොටස්වල අයිතිකරුවන්ට ගෙවිය හැකි ප්‍රමාණයන් තීරණය කිරීම.";

(5) ඒ වගන්තියේ (3) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන උපවගන්තිය ඇතුළත් කිරීමෙන් :–

"(3අ) කළමනාකරණ සංස්ථාව විසින්, පොදු අංගෝපාංගවල මූලික අලුත්වැඩියා කිරීම් කිසිවක් හෝ සංස්ථාවේ වෙනත් යම් සමාන බැඳීම් කිසිවක් ඉටු කිරීම සඳහා වන හදිසි වියදම් සඳහා කළමනාකරණ අරමුදලේ කොටසක් ලෙස (මෙහි මින් මතු "නිදන් අරමුදල" යනුවෙන් සඳහන් කරනු ලබන) නිදන් අරමුදලක් පිහිටවනු ලැබිය යුතු ය. කළමනාකරණ සංස්ථාව විසින්–

(අ) මහා සභාරැස්වීමක දී නිදන් අරමුදලක් සඳහා කලින් කලට වෙන්කළ යුතු මුදල් ප්‍රමාණය තීරණය කිරීම ;

(ආ) දැරිය යුතු යයි නිශ්චිත මුදල් ප්‍රමාණයන් දක්වමින් කළමනාකරණ සංස්ථාව විසින්, සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරියේ එකඟත්වය ඇතිව විශේෂ යෝජනා සම්මතයක් හෝ පොදු යෝජනා සම්මතයක් සම්මත කරගෙන ඇත්නම් මිස, නිදන් අරමුදලකින් කිසියම් වියදමක් දැරීමට ක්‍රියා නොකළ යුතු ය.";

(6) ඒ වගන්තියේ (4) වන, (5) වන සහ (6) වන උපවගන්තිවල "ඒකකයක්" යන වචනය වෙනුවට "සභාධිපත්‍ය කොටස" යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 20ඒ වගන්තිය සංශෝධනය කිරීම.

**34.** ප්‍රධාන ප්‍රඥප්තියේ 20ඒ වගන්තිය පහත දැක්වෙන පරිදි සංශෝධනය කරනු ලැබේ :–

(1) ඒකකය යන වචනය ඒ වගන්තියේ සඳහන් කර ඇති කවර හෝ අවස්ථාවක දී ඒ වෙනුවට "සභාධිපත්‍ය කොටස" යන වචන ආදේශ කිරීමෙන් ";

(2) ඒ වගන්තියේ (6) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන උපවගන්තිය ඇතුළත් කිරීමෙන් :–

"(6අ) මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලින් යම් විධිවිධානයක පටහැනිව කුමක් සඳහන් වුවද කළමනාකරණ සංස්ථාව මගින් මේ පනතේ

20ඌ වගන්තියේ නිශ්චිතව දක්වා ඇති විධිවිධානවලට අනුව ඉල්ලා සිට ඇති මුදල්වලින් යම් මුදලක් ගෙවීම සහාධිපත්‍ය කොටසේ අයිතිකරු පැහැර හරින්නේ නම් ජාතික ජලසම්පාදන සහ ජලාපවහන මණ්ඩලය, ලංකා විදුලිබල මණ්ඩලය, පළාත් පාලන ආයතනය, වෙනත් යම් අධිකාරියක් හෝ බලපත්‍රලාභියා විසින් කළමනාකරණ සංස්ථාව හරහා පුද්ගල සහාධිපත්‍ය කොටසට සපයනු ලබන ජලය, විදුලිය හෝ වෙනත් යම් උපයෝගිතාවක් වැනි සේවා සැපයුම් විසන්ධිකිරීමට අදාළ බලතල කළමනාකරණ සංස්ථාවට තිබිය යුතු ය.

(අ) එසේ විසන්ධි කිරීම සඳහා විශේෂයෙන්ම සම්මත කරගනු ලැබූ යෝජනා සම්මතයක් ඇත්නම් මිස ;

(ආ) යෝජනා සම්මතයේ පිටපතක් සහිතව අපේක්ෂිත විසන්ධි කිරීම පිළිබඳ දින දහ හතරක දැනුම්දීමක් අදාළ සහාධිපත්‍ය කොටසේ අයිතිකරුට ලියාපදිංචි තැපෑලෙන් යවා ඇත්නම් මිස,

කළමනාකරණ සංස්ථාව විසින් සැපයුම විසන්ධි නොකළ යුතු ය.

**35.** ප්‍රධාන ප්‍රඥප්තියේ 20ඔ වගන්තියේ (1) වන උපවගන්තියේ "එක් එක් ඒකකය වගකිව යුතු ය" යන වචනවල සිට ඒ උපවගන්තියේ අවසානය දක්වා වූ සියලු වචන වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :– ප්‍රධාන ප්‍රඥප්තියේ 20ඔ වගන්තිය සංශෝධනය කිරීම.

"ඒ සහාධිපත්‍ය කොටසේ, කොටස් හිමිකම, සියලු සහාධිපත්‍ය කොටස්වල කොටස් හිමිකම්වල මුළු එකතුවට දරන අනුපාතයට අනුව පමණක් එම ඇපකරය යටතේ එක් එක් සහාධිපත්‍ය කොටස යටත් විය යුතු ය.".

**36.** ප්‍රධාන ප්‍රඥප්තියේ 20ඕ වගන්තියේ (1) වන උපවගන්තියේ ඒකකය යන වචනය වෙනුවට "සහාධිපත්‍ය කොටස" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 20ඕ වගන්තිය සංශෝධනය කිරීම.

ප්‍රධාන ප්‍රඥප්තියේ 20ක වගන්තිය සංශෝධනය කිරීම.

**37.** ප්‍රධාන ප්‍රඥප්තියේ 20ක වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

(1) ඒ වගන්තියේ "ඒකකය" යන වචනය යෙදී ඇති සෑම තැනකම ඒ වෙනුවට "සහාධිපත්‍ය කොටස" යන වචන ආදේශ කිරීමෙන් ;

(2) "කළමනාකරණ සංස්ථාව" යන වචන වෙනුවට "සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය හෝ කළමනාකරණ සංස්ථාව" යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 20ග වගන්තිය සංශෝධනය කිරීම.

**38.** ප්‍රධාන ප්‍රඥප්තියේ 20ග වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

(1) ඒ වගන්තියේ "සහාධිපත්‍ය දේපළ" යන වචන යෙදී ඇති සෑම තැනකම ඒ වෙනුවට "සහාධිපත්‍ය දේපළ හෝ අර්ධ සහාධිපත්‍ය දේපළ" යන වචන ආදේශ කිරීමෙන් ;

(2) ඒ වගන්තියේ "ලියාපදිංචි සහාධිපත්‍ය පිඹුර" යන වචන යෙදී ඇති සෑම තැනකම ඒ වෙනුවට "ලියාපදිංචි සහාධිපත්‍ය පිඹුර" හෝ "ලියාපදිංචි අර්ධ සහාධිපත්‍ය පිඹුර" යන වචන පිළිවෙලින් ආදේශ කිරීමෙන් .

ප්‍රධාන ප්‍රඥප්තියේ 20ජ වගන්තිය සංශෝධනය කිරීම.

**39.** ප්‍රධාන ප්‍රඥප්තියේ 20ජ වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

(1) ඒ වගන්තියේ "සහාධිපත්‍ය පිඹුර" යන වචන යෙදී ඇති සෑම තැනකම ඒ වෙනුවට "සහාධිපත්‍ය පිඹුර" හෝ "අර්ධ සහාධිපත්‍ය පිඹුර" යන වචන ආදේශ කිරීමෙන් ;

(2) ඒ වගන්තියේ "ඒකකය" යන වචනය යෙදී ඇති සෑම තැනකම ඒ වෙනුවට "සහාධිපත්‍ය කොටස" යන වචන ආදේශ කිරීමෙන් ;

(3) ඒ වගන්තියේ (අ) ඡේදය ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් :-

"(අ) සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරියට සහ රක්ෂකයාට වහාම දැනුම්දිය යුතු අතර බෙදා වෙන් කරන ලද ගොඩනැගිල්ලේ අලාභ සිදු වී ඇති කොටස අලුත්වැඩියා කොට සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරියේ අධීක්ෂණයට යටත්ව එම බෙදා වෙන්කරන ලද ගොඩනැගිල්ල සම්පූර්ණයෙන් ම හෝ එහි කොටසක් දිගටම ප්‍රයෝජනයට ගැනීම සඳහා යෝජනා ක්‍රමයක් සකස් කළ යුතු ය.".

**40.** ප්‍රධාන ප්‍රඥප්තියේ 20ට වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :- ප්‍රධාන ප්‍රඥප්තියේ 20ට වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තියේ "සහාධිපත්‍ය පිඹුර" යන වචන යෙදී ඇති සෑම තැනකම ඒ වෙනුවට "සහාධිපත්‍ය පිඹුර" හෝ "අර්ධ සහාධිපත්‍ය පිඹුර" යන වචන ආදේශ කිරීමෙන් ;

(2) ඒ වගන්තියේ "සහාධිපත්‍ය දේපළ" යන වචන යෙදී ඇති සෑම තැනකම ඒ වෙනුවට "සහාධිපත්‍ය දේපළ හෝ අර්ධ සහාධිපත්‍ය දේපළ" යන වචන ආදේශ කිරීමෙන් ;

(3) ඒ වගන්තියේ "ඒකකය හෝ ඒකක" යන වචන යෙදී ඇති සෑම තැනකම ඒ වෙනුවට "කොටස" හෝ "සහාධිපත්‍ය කොටස" යන වචන පිළිවෙලින් ආදේශ කිරීමෙන් ;

(4) ඒ වගන්තියේ (2) වන උපවගන්තියෙන් "රෙජිස්ට්‍රාර්වරයා වෙත" යන වචන වෙනුවට "රෙජිස්ට්‍රාර්වරයා සහ සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය වෙත" යන වචන ආදේශ කිරීමෙන් ;

(5) ඒ වගන්තියේ (8) වන උපවගන්තියේ (ඇ) ඡේදය ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් :-

"(ඇ) අවස්ථාවෝචිත පරිදි සහාධිපත්‍ය කොටසට හෝ සහාධිපත්‍ය කොටස්වලට අදාළ සහාධිපත්‍ය හිමිකම්, සහතික තමා වෙත ලැබීමේ දී රෙජිස්ට්‍රාර්වරයා විසින් සහාධිපත්‍ය හිමිකම් සහතික අවලංගු කර

සභාධිපත්‍ය දේපළෙහි හෝ අර්ධ සභාධිපත්‍ය දේපළෙහි සභාධිපත්‍ය කොටස්වලට අදාළ ලේඛනවල අවශ්‍ය සටහන් සිදු කළ යුතු අතර, ඉන්පසුව පැවරුම්ලාභියා විසින් ඉඩම් කොටස සම්බන්ධයෙන් 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ විධිවිධානවලට අනුකූලව කටයුතු කළ යුතු ය.";

(6) ඒ වගන්තියේ (10) වන උපවගන්තිය ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :–

"(10) (5) වන උපවගන්තිය ප්‍රකාරව සභාධිපත්‍ය දේපළක් හෝ අර්ධ සභාධිපත්‍ය දේපළක් හෝ පැවරීම සඳහා ඉල්ලීමක් සිදුකොට ඒ ඉල්ලීම රෙජිස්ට්‍රාර්වරයා විසින් ලියාපදිංචි කර ඇති අවස්ථාවක සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරියේ අධීක්ෂණයට යටත්ව කළමනාකරණ සංස්ථාවේ කටයුතු අවසන් කරනතුරු එම කළමනාකරණ සංස්ථාව අඛණ්ඩව පවත්වාගෙන යා යුතු ය.";

(7) ඒ වගන්තියේ (11) වන උපවගන්තියෙහි "කළමනාකරණ සංස්ථාව" යන වචන වෙනුවට "සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය හෝ කළමනාකරණ සංස්ථාව" යන වචන ආදේශ කිරීමෙන් ;

(8) ඒ වගන්තියේ (12) වන උපවගන්තිය ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :–

"(12) කළමනාකරණ සංස්ථාවේ කටයුතු අවසන් කිරීම සඳහා අධිකරණය විසින් ඈවරකරුවකු පත්කරන්නේ නම් මිස, සහ එසේ පත්කරනතුරු සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරියේ අධීක්ෂණයට යටත්ව කළමනාකරණ සංස්ථාවේ කටයුතු අවසන් කිරීමේ කාර්ය සඳහා කළමනාකරණ සංස්ථාවේ සභාව විසින් දිගටම කරනු ලැබිය යුතු ය. ඈවරකරුවකු පත්කිරීමේ දී කළමනාකරණ සංස්ථාවේ සභාවේ බලතල අවසන් විය යුතු අතර සභාධිපත්‍ය, කළමනාකරණ අධිකාරියේ අධීක්ෂණයට යටත්ව, කළමනාකරණ සංස්ථාවේ කටයුතු අවසන් කිරීමේ කාර්ය සඳහා කළමනාකරණ සංස්ථාවේ සභාවේ බලතල ක්‍රියාත්මක කිරීමට ඈවරකරුට බලය තිබිය යුතු ය.";

(9) ඒ වගන්තියේ (14) වන උපවගන්තිය ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :-

"(14) සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරියේ හෝ කලින් අයිතිකරුවකුගේ හෝ කලින් උකස්කරුවකුගේ හෝ ඇවරකරුවකුගේ ඉල්ලීම මත සහ කළමනාකරණ සංස්ථාවේ කටයුතු අවසන්කර ඇති බවට සෑහීමට පත්වීමෙන් පසුව ඇවරකරු නිදහස් කරනු ලැබිය යුතු බවටත් කළමනාකරණ සංස්ථාව විසුරුවා හරිනු ලැබිය යුතු බවටත්, අධිකරණය විසින් ආඥාවක් කළ හැකි අතර ඒ ආඥාව මේ නීතිය යටතේ ලියාපදිංචි කිරීම සඳහා ඉදිරිපත් කිරීමෙන් පසුව හිමිකම් රෙජිස්ට්‍රාර්වරයා විසින් සහාධිපත්‍ය දේපළේ හෝ අර්ධ සහාධිපත්‍ය දේපළේ සහාධිපත්‍ය කොටස් සම්බන්ධයෙන් හිමිකම් නාම ලේඛනයේ ඇති වාර්තා ලියාපදිංචි කර අවලංගු කරනු ලැබිය යුතු අතර එසේ අවලංගු කිරීම පිළිබඳව සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරියට දැනුම් දිය යුතු ය.".

**41.** ප්‍රධාන ප්‍රඥප්තියේ 26 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :- ප්‍රධාන ප්‍රඥප්තියේ 26 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) "අතිරේක ඒකකය" යන යෙදුමේ අර්ථ කථනය වෙනුවට පහත දැක්වෙන අර්ථ කථනය ආදේශ කිරීමෙන් :-

'"අතිරේක කොටස" යන්නෙන්, වෙනම අයිතිය සඳහා අදහස් කරන ලද කොටසක් අදහස් වන අතර, යම් කාර්යයක් සඳහා යම් නිශ්චිත සහාධිපත්‍ය කොටසක හෝ සහාධිපත්‍ය කොටස්වලට අදාළ වේ.';

(2) "ගොඩනැගිල්ල" යන අර්ථ කථනයේ "සහාධිපත්‍ය උප බෙදුම් පිඹුර" යන වචන යෙදී ඇති සෑම තැනකම ඒ වෙනුවට "සහාධිපත්‍ය පිඹුර හෝ අර්ධ සහාධිපත්‍ය පිඹුර හෝ තාවකාලික සහාධිපත්‍ය පිඹුර" යන වචන ආදේශ කිරීමෙන් ;

(3) "පොදු පහසුකම් මණ්ඩලය" යන යෙදුමේ අර්ථ කථනය වෙනුවට පහත දැක්වෙන අර්ථ කථනය ආදේශ කිරීමෙන් :–

' "සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය" යන්නෙන්, 1973 අංක 10 දරන සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරී පනත යටතේ පිහිටුවනු ලැබූ සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය අදහස් වේ.';

(4) "පොදු අංගෝපාංග" යන යෙදුමේ අර්ථ කථනයෙහි :–

(අ) "සහාධිපත්‍ය දේපළ" යන වචන වෙනුවට "සහාධිපත්‍ය දේපළ හෝ අර්ධ සහාධිපත්‍ය දේපළ හෝ තාවකාලික සහාධිපත්‍ය දේපළ" යන වචන ආදේශ කිරීමෙන් ;

(ආ) "සහාධිපත්‍ය පිඹුර" යන වචන වෙනුවට "සහාධිපත්‍ය පිඹුර හෝ අර්ධ සහාධිපත්‍ය පිඹුර හෝ තාවකාලික සහාධිපත්‍ය පිඹුර" යන වචන ආදේශ කිරීමෙන් ;

(ඇ) "ඉඩම" යන වචනය වෙනුවට "ඉඩම් කොටස" යන වචන ආදේශ කිරීමෙන් ;

(ඈ) "ඒකකය" යන වචනය වෙනුවට "සහාධිපත්‍ය කොටස" යන වචන ආදේශ කිරීමෙන් ;

(5) "සහාධිපත්‍ය පිඹුර" යන යෙදුමේ අර්ථ කථනය වෙනුවට පහත දැක්වෙන අර්ථ කථනය ආදේශ කිරීමෙන් :–

"සහාධිපත්‍ය පිඹුර යන්නෙන්–

(අ) සහාධිපත්‍ය පිඹුරක් ලෙස නමේ හෝ ශීර්ෂයේ විස්තර කර ඇති ;

(ආ) මහල් දෙකක් හෝ ඊට වැඩි ගණනකට බෙදා වෙන්කර ඇති වූ ද සහාධිපත්‍ය කොටස් දෙකක් හෝ ඊට වැඩි ගණනකට බෙදා වෙන්කර ඇති

වූ ද, සම්පූර්ණ කරන ලද ගොඩනැගිල්ලක් හෝ කොටස්වලට නැවත වෙන්කළ හැකි එක් මහලක් සහිත එක ගොඩනැගිල්ලක් සමන්විත වන ඉඩම් කොටසක් සම්පූර්ණයෙන් ම හෝ එහි කොටසක් පමණක් පෙන්නුම් කරන : සහ

(ඇ) 5 වන වගන්තියේ දක්වා ඇති තොරතුරු අන්තර්ගත, සහාධිපත්‍ය දේපළට

පිඹුරක් අදහස් වේ.

(6) "සහාධිපත්‍ය පිඹුර" යන යෙදුමේ අර්ථ කථනයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අර්ථ කථනය ඇතුළත් කිරීමෙන් :-

'"සහාධිපත්‍ය කොටස" යන්නෙන්, සහාධිපත්‍ය පිඹුරක හෝ අර්ධ සහාධිපත්‍ය පිඹුරක හෝ තාවකාලික සහාධිපත්‍ය පිඹුරක ස්වාධීන කොටසක් ලෙස පෙන්නුම් කර ඇති වූ ද මහල් එකකට වැඩි ගණනකින් යුත් ගොඩනැගිල්ලක එක් මහලක හෝ එකකට වැඩි මහල් ගණනක හෝ පිහිටියා වූ ද කාමර එකකින් හෝ ඊට වැඩි ගණනකින් සමන්විත වන්නා වූ ද, වාසනම පාවිච්චි කිරීම සඳහා සැලසුම් කරනු ලැබුවා වූ ද වෙන් වශයෙන් වූ සහාධිපත්‍ය කොටසක් ලෙස පෙන්නුම් කර ඇත්තා වූ ද අර්ථ කථනය කරන ලද ඉඩ ප්‍රමාණයන් අදහස් වේ.';

(7) "බැඳීම" යන යෙදුමේ අර්ථ කථනයෙහි "ඒකකය" යන වචනය යෙදී ඇති සෑම තැනකම ඒ වෙනුවට "කොටස" යන වචනය ආදේශ කිරීමෙන් ;

(8) '"ඉඩම" යන යෙදුමේ අර්ථ කථනය වෙනුවට පහත දැක්වෙන අර්ථ කථනය ආදේශ කිරීමෙන් :-

"ඉඩම් කොටස" යන්නට, යම් භුක්තියක ඉඩම් කොටසක් යම් ගොඩනැගිල්ලක් හෝ එහි කොටසක් යම් අයිතිකරුවකු විසින් සාධාරණ ලෙස භුක්ති විඳිනු ලබන ඉහළ අවකාශයක් සහ (1973 අංක 4 දරන පතල් සහ ඛනිජ සම්පත් නීතියේ අර්ථානුකූල වූ ඛණිජ සම්පත් හැර) පොළව මතුපිටට යටින් ඇති සියලු ද්‍රව්‍ය පොළවෙන් මතුපිටට රැගෙන එනු ලැබුව ද, එසේ නැතිවුව ද එම ද්‍රව්‍ය සහ යම් බූදලයක් හෝ එහි සම්බන්ධතාවක් අදහස් වේ.';

(9) "පළාත් පාලන ආයතනය" යන යෙදුමේ අර්ථ කථනය "සහාධිපත්‍ය දේපළ" යන වචන වෙනුවට "සහාධිපත්‍ය දේපළ හෝ අර්ධ සහාධිපත්‍ය දේපළ හෝ තාවකාලික සහාධිපත්‍ය දේපළ" යන වචන ආදේශ කිරීමෙන් ;

(10) "කළමනාකරණ සංස්ථාව" යන යෙදුමේ අර්ථ කථනය වෙනුවට පහත දැක්වෙන අර්ථ කථනය ආදේශ කිරීමෙන් :–

' "කළමනාකරණ සංස්ථාව" යන්නෙන්, "සහාධිපත්‍ය පිඹුරක පෙන්නුම් කර ඇති සම්පූර්ණ කළ සහ නැවත බෙදා වෙන් කළ ගොඩනැගිලි එකක් හෝ ඊට වැඩි ප්‍රමාණයකට අදාළව නැතහොත් අර්ධ සහාධිපත්‍ය පිඹුරක පෙන්නුම් කර ඇති අර්ධ වශයෙන් සම්පූර්ණ කරන ලද ගොඩනැගිලි එකක් හෝ ඊට වැඩි ගණනකට අදාළව ඒ ගොඩනැගිලි සඳහා පිහිටුවනු ලැබූ කළමනාකරණ සංස්ථාව අදහස් වේ.';

(11) "අයිතිකරු" යන යෙදුමේ අර්ථ කථනයෙහි "ඒකකය" යන වචනය වෙනුවට "සහාධිපත්‍ය කොටස" යන වචන ආදේශ කිරීමෙන් ;

(12) "නියමිත" යන යෙදුමේ අර්ථ කථනයට ඉක්බිතිව ම පහත දැක්වෙන අර්ථ කථනය ඇතුළත් කිරීමෙන් :–

"තාවකාලික සහාධිපත්‍ය පිඹුර"

(අ) තාවකාලික සහාධිපත්‍ය පිඹුරක් ලෙස එහි නමෙහි හෝ ශීර්ෂයෙහි විස්තර කර ඇති වූ ද ;

(ආ) ඉඩම් කොටසක් සහ ඉදිකිරීමට යෝජිත සහ කොටස්වලට නැවත වෙන්කළ හැකි යම් ගොඩනැගිල්ලක් සම්පූර්ණයෙන් ම හෝ අර්ධ වශයෙන් පෙන්නුම් කරන ;

(ඇ) 5අ වගන්තියේ ඇති විස්තර ඇතුළත් වන,

තාවකාලික සහාධිපත්‍ය දේපළක පිඹුරක් අදහස් වේ.

'"අපේක්ෂිත ගැණුම්කරුවකු" යන්නෙන්, සහාධිපත්‍ය දේපළක හෝ අර්ධ සහාධිපත්‍ය දේපළක හෝ තාවකාලික සහාධිපත්‍ය දේපළක අයිතිකරුගෙන් සහාධිපත්‍ය කොටසක් හෝ තාවකාලික සහාධිපත්‍ය කොටසක් මිල දී ගැනීමට එකඟ වෙමින් විකිණීම සඳහා වූ ගිවිසුමකට පාර්ශ්වකරුවකු වන තැනැත්තෙක් අදහස් වේ.';

"පිළිගත් මූල්‍ය ආයතනය" යන්නෙන්-

(අ) 1988 අංක 30 දරන බැංකු පනතේ අර්ථානුකූල වූ "බලපත්‍රලාභී වාණිජ බැංකුවක්" හෝ "බලපත්‍රලාභී විශේෂිත බැංකුවක් ";

(ආ) 1988 අංක 78 දරන මූල්‍ය සමාගම් පනත යටතේ ලියාපදිංචිකර ඇති යම් මූල්‍ය සමාගමක් ;

(ඇ) 401 වන පරිච්ඡේදය වන ජාතික නිවාස පනත යටතේ ජාතික නිවාස කොමසාරිස්වරයා වෙත ලියාපදිංචි කර ඇති ගොඩනැඟිලි සමිතියක් ;

(ඈ) 1979 අංක 17 දරන ජාතික නිවාස සංවර්ධන අධිකාරිය පනත මගින් පිහිටුවනු ලැබූ ජාතික නිවාස සංවර්ධන අධිකාරිය; හෝ

(ඉ) වෙනත් යම් නීතියක් මගින් හෝ යටතේ පිහිටුවනු ලැබූ යම් බැංකුවක්,

අදහස් වේ.

(13) "රෙජිස්ට්‍රාර්" යන යෙදුමේ අර්ථ කථනය වෙනුවට පහත දැක්වෙන අර්ථ කථනය ආදේශ කිරීමෙන් ;-

'"රෙජිස්ට්‍රාර්" යන්නෙන්, 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත යටතේ පත්කරනු ලැබුවා වූ ද, සහාධිපත්‍ය දේපළ හෝ අර්ධ සහාධිපත්‍ය දේපළ හෝ තාවකාලික සහාධිපත්‍ය දේපළ පිහිටි ලියාපදිංචි කිරීමේ දිස්ත්‍රික්කය විෂයෙහි බලය ඇති වූ ද හිමිකම් පිළිබඳ රෙජිස්ට්‍රාර්වරයා අදහස් වේ.';

(14) "රෙජිස්ට්‍රාර්" යන වචනයේ අර්ථ නිරූපණයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අර්ථ නිරූපණය ඇතුළත් කිරීමෙන් :-

"අර්ධ සහාධිපත්‍ය පිඹුර" යන්නෙන් -

(අ) එහි මාතෘකාවේ හෝ ශීර්ෂයෙහි අර්ධ සහාධිපත්‍ය පිඹුර ලෙස විස්තර කර ඇත්තා වූ ද ;

(ආ) එයට ඇතුළත් ඉඩම් කොටසේ සම්පූර්ණයෙන් ම හෝ එහි යම කොටසක, මහල් එකකින් යුක්ත අර්ධ වශයෙන් සම්පූර්ණ කරන ලද සහාධිපත්‍ය කොටස් දෙකක් හෝ ඊට වැඩි ප්‍රමාණයකට නැවත බෙදනු ලැබිය හැකි වූ ද, අනාගතයේ දී මහල් එකක් හෝ කිහිපයක් ඉදිකිරීම සඳහා ඉඩ සළසා ඇත්තා වූ ද, නැතහොත් කොටස්වලට වෙන් කළ හැකි එක් මහලකින් සමන්විත අර්ධ වශයෙන් සම්පූර්ණ කරන ලද ගොඩනැගිල්ලක් පෙන්නුම් කරන ;

(ඇ) 5ආ වගන්තියේ දක්වා ඇති විස්තර අඩංගු වූ ;

(ඈ) මනුෂ්‍ය වාසයට සුදුසු වූ ද සම්පූර්ණයෙන් සාදා නිමකරනු ලැබුවා වූ ද සහාධිපත්‍ය කොටස් එකකට වැඩි ප්‍රමාණයක් ඇත්තා වූ ද,

කොටසක් සම්පූර්ණ කරන ලද සහාධිපත්‍ය දේපළක පිඹුරක් අදහස් වේ.

(15) "කොටස් ඒකකය" යන යෙදුමේ අර්ථ කථනය වෙනුවට පහත දැක්වෙන අර්ථ කථනය ආදේශ කිරීමෙන් :-

සහාධිපත්‍ය කොටසක් සම්බන්ධයෙන් වන විට "අයත් කොටසේ කොටස" යන්නෙන්, සහාධිපත්‍ය කොටසේ අගයට අනුව ඒ සහාධිපත්‍ය කොටස සඳහා තීරණය කරනු ලැබුවා වූ ද සහාධිපත්‍ය පිඹුරේ හෝ අර්ධ සහාධිපත්‍ය පිඹුරේ හෝ තාවකාලික සහාධිපත්‍ය පිඹුරේ සටහන් කර ඇති උපලේඛනයෙහි කොටස ලෙස පෙන්නුම් කර ඇති වූ ද අයත් කොටසේ කොටසක් අදහස් වේ

(16) "මහල" යන යෙදුමේ අර්ථ කථනයෙහි ඇති "ඉඩම" යන වචනය වෙනුවට "ඉඩම් කොටස" යන වචන ආදේශ කිරීමෙන් ;

(17) "නැවත බෙදා වෙන්කිරීමේ ගොඩනැගිල්ල" යන යෙදුමේ අර්ථ කථනයෙහි "සහාධිපත්‍ය පිඹුර" යන වචන වෙනුවට "සහාධිපත්‍ය පිඹුර" හෝ "අර්ධ සහාධිපත්‍ය පිඹුර" හෝ "තාවකාලික සහාධිපත්‍ය පිඹුර" යන වචන ආදේශ කිරීමෙන් ;

(18) "ඒකකය" යන යෙදුමේ අර්ථ කථනය අත්හැරීමෙන් ;

(19) "ඒකමතික යෝජනා සම්මතයක්" යන යෙදුමේ අර්ථ කථනයට ඉක්බිතිව ම පහත දැක්වෙන අර්ථ කථනය එකතු කිරීමෙන් :-

' "අනවසර ඉදිකිරීම්" යන්නෙන්, ගොඩනැගිලි සැලැස්ම අනුමත කිරීමට නීතිය මගින් බලය පවරා ඇති බලධාරීන්ගෙන් වලංගු අවසර පත්‍රයක් නොමැතිව හෝ අදාළ සහාධිපත්‍ය දේපළ සඳහා අනුමත කරන ලද ගොඩනැගිලි සැලැස්ම සම්බන්ධයෙන් නිකුත් කරන ලද අවසර පත්‍රයේ දක්වා ඇති යම් නියම හෝ කොන්දේසිවලට පටහැනිව, සහාධිපත්‍ය කොටසට හෝ ඒ සහාධිපත්‍ය කොටසේ යම් සහායක කොටසක කරන ලද යම් වැඩිදියුණු කිරීමක් හෝ වෙනස් කිරීමක් ද පොදු අංගෝපාංගවලට කරන ලද යම් වැඩිදියුණු කිරීමක් හෝ වෙනස් කිරීමක් ද සහාධිපත්‍ය දේපළ හෝ අර්ධ සහාධිපත්‍ය දේපළ ඉදිකර ඇති ඉඩම් කොටසේ යම් කොටස් කිරීමක් හෝ නැවත බෙදීමක් ද, සහාධිපත්‍ය දේපළ හෝ අර්ධ සහාධිපත්‍ය දේපළ ඉදිකර ඇති ඉඩම් කොටස මත උප ව්‍යුහයන් සහ වෙනත් තැනීම් කටයුතු ඉදිකිරීම්, ඒ ඉඩම් කොටසට ඉහලින් හෝ ඊට පහලින් ගොඩනැගිල්ලෙන් පිටතට ඉදිකිරීම් කටයුතු කිරීම හෝ ඉඩම් කොටස හෝ යම් ගොඩනැගිල්ලක් හෝ යම් ව්‍යුහයක් භාවිත කරනු ලබන පරමාර්ථය වෙනස් කිරීම අදහස් වේ.'.

ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනය සංශෝධනය කිරීම.

**42.** ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :–

(1) "ඒකකය" යන වචනය උපලේඛනයේ සඳහන් කර ඇති සෑම තැනකම ඒ වෙනුවට "සහාධිපත්‍ය කොටස" යන වචන ආදේශ කිරීමෙන් ;

(2) ඒ උපලේඛනයෙහි 2 වන අයිතමයෙහි "සහාධිපත්‍ය පිඹුර" යන වචන වෙනුවට "සහාධිපත්‍ය පිඹුර හෝ අර්ධ සහාධිපත්‍ය පිඹුර" යන වචන ආදේශ කිරීමෙන් ;

(3) ඒ උපලේඛනයෙහි 3 (2) වන අයිතමය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන උපඡේදය ආදේශ කිරීමෙන් :–

" (2) අයිතිකරුවන් තිදෙනකුට වැඩි නොවූ පිරිසක් ඇති අවස්ථාවක, සභාව සියලු අයිතිකරුවන්ගෙන් සමන්විත විය යුතු ය.";

(4) ඒ උපලේඛනයෙහි 8 (5) වන අයිතමයෙහි "සභාවේ මහා සභා රැස්වීමට පසු සභාව විසින්" යන වචන වෙනුවට "සභාව විසින්, සභාවේ මහ සභා රැස්වීමට පසු දින තිහක් ඇතුළත" යන වචන ආදේශ කිරීමෙන් ;

(5) ඒ උපලේඛනයෙහි 9 (2) වන අයිතමයෙහි "පළමුවන වාර්ෂික මහා සභා රැස්වීම" යන වචන වෙනුවට "මේ පනතේ 20ආ වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, පළමුවන වාර්ෂික මහා සභා රැස්වීම" යන වචන ආදේශ කිරීමෙන් ;

(6) උපලේඛනයෙහි 10 (2) (ආ) අයිතමයට ඉක්බිතිව ම පහත දැක්වෙන අයිතමය එකතු කිරීමෙන් :–

"(ඇ) සහාධිපත්‍ය කළමනාකරන අධිකාරිය විසින් ලිඛිතව කරනු ලබන අධිග්‍රහණයක් මත, විශේෂ මහා සභා රැස්වීමක් කැඳවනු ලැබිය යුතු ය.";

43. ප්‍රධාන ප්‍රඥප්තියේ දෙවන උපලේඛනය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :–

ප්‍රධාන ප්‍රඥප්තියේ දෙවන උපලේඛනය සංශෝධනය කිරීම.

(1) ඒ උපලේඛනයේ ශීර්ෂයෙහි "ලියාපදිංචි සහාධිපත්‍ය පිඹුර" යන වචන වෙනුවට "ලියාපදිංචි සහාධිපත්‍ය පිඹුර හෝ අර්ධ සහාධිපත්‍ය පිඹුර" යන වචන ආදේශ කිරීමෙන් ;

(2) ඒ උපලේඛනයෙහි 1(1) වන අයිතමයෙහි–

(අ) "ලියාපදිංචි සහාධිපත්‍ය පිඹුර" යන වචන වෙනුවට "ලියාපදිංචි සහාධිපත්‍ය පිඹුර හෝ ලියාපදිංචි අර්ධ සහාධිපත්‍ය පිඹුර" යන වචන ආදේශ කිරීමෙන් ;

(ආ) "ඒකකය" යන වචනය සඳහන් කර ඇති සෑම තැනකම ඒ වෙනුවට "සහාධිපත්‍ය කොටස" යන වචන ආදේශ කිරීමෙන් ;

(3) ඒ උපලේඛනයෙහි –

(අ) 2(අ) (iv) වන අයිතමයෙහි "ස්වකීය කාර්ය ඉටුකිරීම හා සම්බන්ධ" යන වචන වෙනුවට "ස්වකීය කාර්ය ඉටුකිරීම හෝ ස්වකීය බලතල ක්‍රියාත්මක කිරීම හා සම්බන්ධ" යන වචන ආදේශ කිරීමෙන් ;

(ආ) 2 (ආ) අයිතමයෙහි "කවර හෝ ආඥාවක් විසින් නියම කරනු ලබන සියලු වැඩ කළ යුතු ය." යන වචන වෙනුවට "සියලු අනවසර ඉදිකිරීම් ඉවත්කිරීම ඇතුළු ආඥාව විසින් නියම කරනු ලබන සියලු වැඩ කළ යුතු ය." යන වචන ආදේශ කිරීමෙන් ;

(ඇ) 2(උ) අයිතමයට ඉක්බිතිව ම පහත දැක්වෙන ඡේද එකතු කිරීමෙන් :–

"(ඌ) සංස්ථාවේ කළමනාකරණ අරමුදලට ඔහුගේ දායක මුදල් ගෙවීම ;

(එ) ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය, ලංකා විදුලි බල මණ්ඩලය, පළාත් පාලන ආයතනය, වෙනත් යම් අධිකාරියක් හෝ බලපත්‍රලාභියා විසින් සංස්ථාව හරහා සපයනු

ලබන ජල සේවා, විදුලි බලය, සහ වෙනත් උපයෝගි සේවා විසන්ධි කරනු ලබන විටක, සේවය ඇති කිරිමේ ගාස්තු සහ නැවත සම්බන්ධ කිරිමේ ගාස්තු ඇතුළු සංස්ථාව හරහා සපයනු ලබන ජල සේවා, විදුලි බලය සහ වෙනත් උපයෝගි සේවා වැනි සේවා පරිභෝජනය කිරිම සඳහා සියලු මාසික ගාස්තු ගෙවීම;

(4) ඒ උපලේඛනයෙහි 5 වන අයිතමයෙහි–

(අ) 5(අ) අයිතමයට ඉක්බිතිව ම පහත දැක්වෙන කොටස ඇතුළත් කිරීමෙන් :–

"(අඅ) සහාධිපත්‍ය දේපළ හෝ අර්ධ සහාධිපත්‍ය දේපළ සඳහා අනුමත කරන ලද ගොඩනැගිලි සැලැස්මට පටහැනිව සහාධිපත්‍ය කොටස්වල යම් තනි අයිතිකරුවන් විසින් යම් අනවසර ඉදිකිරීම් සිදුකිරිම වැළැක්වීම ;

(අආ) අනුමත ගොඩනැගිලි සැලැස්මට පටහැනිව සහාධිපත්‍ය දේපළට හෝ අර්ධ සහාධිපත්‍ය දේපළට සිදුකරන ලද සියලු අනවසර ඉදිකිරීම් ඉවත් කිරිම සඳහා සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරියෙන් හෝ නාගරික සංවර්ධන අධිකාරියෙන් හෝ පළාත් පාලන ආයතනයෙන් ඉල්ලා සිටීම හා එම ආයතනවලට සහායවීම ;"

(ආ) 5 (ඇ) අයිතමයට ඉක්බිතිව ම පහත දැක්වෙන කොටස එකතු කිරීමෙන් :–

"(ඉ) ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය, ලංකා විදුලිබල මණ්ඩලය, පළාත් පාලන ආයතනය, වෙනත් යම් ආයතනයක් හෝ බලපත්‍රලාභියා වැනි සේවා සපයන නියෝජිත ආයතන වෙනුවෙන් අනුයෝජිතයකු ලෙස ක්‍රියා කරමින් සහාධිපත්‍ය කොටස්වල අයිතිකරුවන්ට ජල සේවා, විදුලි බලය, සහ වෙනත් මහජන උපයෝගිතා සැපයීම සහ එම සේවා පරිභෝජනය කිරිම වෙනුවෙන් ගාස්තු සඳහා හිමිකම් පාමින් මාසික හෝ වාර බිල්පත් යැවීම සහ එම ගාස්තු අදාළ සහාධිපත්‍ය කොටස්වල අයිතිකරුවන්ගෙන් අයකර ගැනිම සහ එම ගාස්තු අදාළ සේවා නියෝජිත ආයතන වෙත යැවීම. "

(5) ඒ උපලේඛනයෙහි 6(ආ) අයිතමයට ඉක්බිතිව ම පහත දැක්වෙන ඡේදය ඇතුළත් කිරීමෙන් :–

"(ආආ) සහාධිපත්‍ය දේපළෙහි හෝ අර්ධ සහාධිපත්‍ය දේපළෙහි අනුමත ගොඩනැගිලි සැලැස්මට පටහැනිව, තම සහාධිපත්‍ය කොටසට යම් වෙනස් කිරීමක් සිදුකරන,".

**44.** 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ විධිවිධාන, අවස්ථාවෝචිත පරිදි යම් පළාතකට, පරිපාලන දිස්ත්‍රික්කයකට, හෝ පරිපාලන කොට්ඨාසයකට අදාළවීම ව්‍යාප්ත කරමින් එකී පනතේ 1 වන වගන්තිය යටතේ නියමයක් කරන තුරු, ඉහත කී එම පළාතක, පරිපාලන දිස්ත්‍රික්කය හෝ පරිපාලන කොට්ඨාසය තුළ පිහිටි අවස්ථාවෝචිත පරිදි යම් සහාධිපත්‍ය දේපළක්, තාවකාලික සහාධිපත්‍ය දේපළක් හා අර්ධ සහාධිපත්‍ය දේපළක් සම්බන්ධයෙන් වූ – සැක දුරු කිරීම.

(අ) සහාධිපත්‍ය පිඹුරක්, තාවකාලික සහාධිපත්‍ය පිඹුරක් හෝ අර්ධ සහාධිපත්‍ය පිඹුරක් ;

(ආ) ලියාපදිංචි සහාධිපත්‍ය පිඹුරක, ලියාපදිංචි තාවකාලික සහාධිපත්‍ය පිඹුරක හෝ ලියාපදිංචි අර්ධ සහාධිපත්‍ය පිඹුරක සංශෝධන පිඹුරක් ;

(ඇ) ලියාපදිංචි සහාධිපත්‍ය පිඹුරක හෝ ලියාපදිංචි අර්ධ සහාධිපත්‍ය පිඹුරක නැවත බෙදීමේ හෝ ඒකාබද්ධ කිරීමේ පිඹුරක්,

මේ පනතේ විධිවිධානවලට අනුකූලව ලියාපදිංචි කිරීමට සහ ඒ සම්බන්ධයෙන්, (117 වන අධිකාරය වූ) ලේඛන ලියාපදිංචි කිරීමේ ආඥා පනත අදාළ විය යුතු බව සැක දුරුකිරීමේ කාර්ය සඳහා මෙයින් ප්‍රකාශ කරනු ලැබේ.

**45** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය. අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත පැම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.